# මාසික මහ සභා රැස්වීම - 2023/02/14 දින
# අලව්ව ප්‍රාදේශීය සභාව

2023/02/14 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 59 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ  ගරු මන්ත්‍රීතුමන්ලා**

| | | |
|---|---|---|
| 1. ගරු සභාපතිනි | - | පද්මා වැත්තැව මැතිනිය |
| 2. ගරු උප සභාපති | - | එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා |
| 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා |
| 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා |
| 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.පී  ධනුෂ්ක වීරසිංහ මැතිතුමා |
| 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා |
| 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා |
| 8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා |
| 9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඒ කරුණාරත්න මැතිතුමා |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | - | එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ  මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම් ජයතිලක මැතිතුමා |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා |
| 20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | - | කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය |
| 21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | - | ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය |
| 22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | - | ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය |
| 23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා |
| 24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා |
| 25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | - | සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය |
| 26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.පී නන්දසිරි මැතිතුමා |

**මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා**

| | | |
|---|---|---|
| 1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි | - | ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය |
| 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා |

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 59 වන මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රිතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත් අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## 01. <u>2023/01/10 දින මහ සභා වාර්තාව ස්ථිර කිරීම.</u>

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2023.01.10 දින මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තා ස්ථිර කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2023.01.10 දින පැවති VI වන සැසිවාරයේ 58 වන මහ සභා රැස්වීම් වාර්තාව ස්ථිර කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ර්.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.01.10 දින පැවති VI වන සැසිවාරයේ 58 වන මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 03. <u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම</u>.

### 03.1 <u>1990 සුවසැරිය ගිලන් රථයක් ලබා ගැනීම සම්බන්ධව.</u>

1990 සුවසැරිය ගිලන් රථයක් ලබා ගැනීම සම්බන්ධයෙන් අප සභාව විසින් ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමට අනුව එම ගිලන් රථය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස දන්වමින් ජනාධිපති කාර්යාලය විසින් අප සභාවටද පිටපත් සහිතව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අංක MH/MS/07/01/SUWA/2022 හා 2023.01.31 දිනැතිව ප්‍රධාන විධායක නිලධාරී, 1990 සුවසැරිය පදනම වෙත අප සභාවටද පිටපත් සහිතව ලිපියක් යොමු කර ඇත. එම ලිපි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

1990 සුවසැරිය ගිලන් රථයක් ලබා ගැනීම සම්බන්ධයෙන් අප සභාව විසින් ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමට අනුව එම ගිලන් රථය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස දන්වමින් ජනාධිපති කාර්යාලය විසින් අප සභාවටද පිටපත් සහිතව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අංක MH/MS/07/01/SUWA/2022 හා 2023.01.31 දිනැතිව ප්‍රධාන විධායක නිලධාරී, 1990 සුවසැරිය පදනම වෙත අප සභාවටද පිටපත් සහිතව යොමු කළ ලිපි ගරු මහ සභාවේ දැනගැනීමට ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම ඉල්ලීමක් කරනවා සුවසැරි ගිලන් රථය පිළිබඳ ඇසූ ලිපි වල පිටපත් ලබා දෙන්න කියලා.

**03.2** <u>නව වරිපනම් අංකයක් ලබා ගැනීම සඳහා.</u>

61/2, නාරම්මල පාර, අලව්ව ලිපිනයේ ජී. චන්ද්‍රතිලක මහතා විසින් 2023.01.20 දිනැතිව ඉදිරිපත් කල ඇති ලිපියට අනුව ඔහු හට 2021 වර්ෂය දක්වා දම්පැලැස්ස පාර වම අංක 61/2 ලෙස වරිපනම් අංකයක් ලබා දී තිබූ නමුත් 2022 වර්ෂයේ සිට 61/2 ලෙස තක්සේරු වාර්තාවක් නොලැබුන බවත් ඔහු ණය මුදලක් ලබාගෙන ඇති අතර ඒ සඳහා ද භාවිතා කර ඇත්තේ 61/2 යන අංකය බවත් එබැවින් ඔහු හට දම්පැලැස්ස පාර වම, 61/2 අංකයම ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කර ඇත.

ආදායම් පරීක්ෂක වාර්තාවට අනුව මෙම දේපල සඳහා ප්‍රාදේශීය සභාව විසින් දම්පැලැස්ස පාර වම, අංක 61/2 ලෙස තාවකාලික අංකයක් ලබා දී 2021 වර්ෂයට අදාලව වරිපනම් ගාස්තු අයකර ඇති බවත් නමුත් 2022 වර්ෂයේ සිට නව තක්සේරුව ක්‍රියාත්මක වන නිසා මෙම දේපල සඳහා වරිපනම් අංකයක් ලබා දී නොමැති බවත් ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම දේපල දම්පැලැස්ස පාර, වම අංක 61 න් කොටසක් වශයෙන් නිරීක්ෂණය වූ බවත් එහි ගොඩනැගිල්ලක්ද තනා ඇති බවත්, එබැවින් මෙම ගොඩනැගිල්ල සඳහා 61/2 යන අංකයම ලබා දීම සුදුසු බවට වාර්තා කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ආදායම් පරික්ෂක මහතා විසින් ස්ථාන පරීක්ෂාවක් කර කරුණු සනාථ කර ඇති නිසා ඔහු ඉල්ලා ඇති වරිපනම් අංකය ඔහුට ලබාදිම සුදුසු යැයි මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 61/2, නාරම්මල පාර, අලව්ව ලිපිනයේ ජී. චන්ද්‍රතිලක මහතා හට ගොඩනැගිල්ල සඳහා 61/2 යන අංකයම ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**03.3** <u>වරිපනම් මුදල් සම්බන්ධව.</u>

නො. 180/1, දිවුල්ගහමුලවත්ත, උරුලෑමුල්ල, අලව්ව ලිපිනයේ ජේ.බී. චන්ද්‍රිකා මහත්මිය විසින් 2023.01.13 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපියට අනුව ඇය ඉහත ලිපිනයෙහි අවුරුදු 36 ක පමණ කාලයක් ජීවත් වන බවත් ස්ථිර රැකියාවක් නොමැති බැවින් මීට පෙර ද වරිපනම් මුදල ගෙවීම නිදහස් කර ඇති බවත් දන්වමින් ඇය හට සාධාරණයක් ඉටු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

අංක 1011, ඔතර කිරුවම්පොල වසම භාර ග්‍රාම නිලධාරී විසින් ජේ.බී. චන්ද්‍රිකා මහත්මිය අඩු ආදායම්ලාභී තැනැත්තියක බව දන්වා සිටින අතර ආදායම් පරීක්ෂක වාර්තාවට අනුව මේ සම්බන්ධව කරන ලද ක්ෂේත්‍ර පරික්ෂණයේදීද ඇය අඩු ආදායම්ලාභී තැනැත්තියක බව නිරීක්ෂණය වූ බවත් එබැවින් වරිපනම් බිල් කිරීම වසරකින් නැවැත්වීම සුදුසු බවත් දන්වා ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම කාන්තාවට ස්ථිර ආදායම් මාර්ගයක් නෑ. ඔවුන්ට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති බවට ග්‍රාම නිලධාරි මහතාත් ආදායම් පරික්ෂක මහතාත් සහතික කර තිබෙනවා. ඒ නිසා ඔවුන් යම් ස්ථාවර මට්ටමකට එනතුරු වසරක කාලයක් සඳහා ඇය එම වරිපනම් බද්දෙන් නිදහස් කිරිම සුදුසු යැයි මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව නො. 180/1, දිවුල්ගහමුලවත්ත, උරුලෑමුල්ල, අලව්ව ලිපිනයේ ජේ.බී. චන්ද්‍රිකා මහත්මිය වසරක කාලයක් සඳහා වරිපනම් බද්දෙන් නිදහස් කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**03.4** <u>**වරිපනම් අංකයක් ඉවත් කරගැනීම.**</u>

කැප්පිටිවලාන, මීපිටිගෙදර ලිපිනයේ ඩබ්.එස්. සිබින් නෝනා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව තහඩු සෙවිලිකල 292/A දරණ පොල් ලී මඩුව තහඩු ගලවා ඉවත් කර ඇති බවත් දැනට නිවස ඇති ඉඩමේම කොටසකටත් වරිපනම් මුදල් ගෙවන බවත් එබැවින් 292/A තහඩු සෙවිලි කල කොටස වරිපනම් ගෙවීමෙන් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලීමක් කර ඇත. එමෙන්ම ආදායම් පරීක්ෂක වාර්තාවට අනුව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එම ඉඩමේ පැරණි ගොඩනැගිල්ලක් කඩා ඉවත්කර ඇති බව දක්නට ලැබුනු බව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** එස්.එම් ජයතිලක මැතිතුමා
ගරු සභාපතිතුමියනි, 292/A තහඩු සෙවිලි කල කොටස ගලවා ඉවත් කර ඇති බැවින් එම කොටසේ වරිපනම් ගෙවීම නිදහස් කර දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව කැප්පිටිවලාන, මීපිටිගෙදර ලිපිනයේ ඩබ්.එස්. සිබින් නෝනා මහත්මිය විසින් 292/A දරණ පොල් ලී මඩුව තහඩු ගලවා ඉවත් කර ඇති බැවින් වරිපනම් බද්දෙන් නිදහස් කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**03.5** <u>**නිවස සඳහා දේපල බදු ගෙවීමට සහනයක් ලබා ගැනීම.**</u>

1 කණුව, වත්තේගෙදර, නාරම්මල පාර, අලව්ව ලිපිනයේ කේ.ජී. ශ්‍රියානි පුෂ්පකාන්ති මහත්මිය විසින් 2023.01.17 දිනැතිව යොමු කර ඇති ලිපියට අනුව ස්ථිර පදිංචිව සිටින ගනේකන්ද වරිපණම් අංක 27 සඳහා 2022.12.31 දිනට ගෙවීමට රු. 2,549.75 ක හිඟ මුදලක් ගෙවීමට ඇති බවත් ස්ථිර රැකියාවක් හෝ ආදායම් මාර්ගයක් නොමැති බවත් එබැවින් ඒ සඳහා සහනයක් ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කර ඇත. අංක 1000 අලව්ව උතුර වසම භාර ග්‍රාම නිලධාරී විසින් හා ආදායම් පරීක්ෂක විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවලට අනුවද ඇය හට ස්ථිර රැකියාවක් හෝ ආදායම් මාර්ගයක් නොමැති බව තහවුරු කර ඇති අතර මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී** එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
ගරු සභාපතිතුමියනි, මෙම නිවසේ කාන්තාවන් දෙදෙනෙක් පමණයි සිටින්නේ. ඔවුන්ට ස්ථිර ආදායම් මාර්ගයක් නෑ. ඒ නිසා ඔවුන්ට සහනයක් ලබාදීම සුදුසු යැයි මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 1 කණුව, වත්තේගෙදර, නාරම්මල පාර, අලව්ව ලිපිනයේ කේ.ජී. ශ්‍රියානි පුෂ්පකාන්ති මහත්මිය වසරක කාලයක් සඳහා වරිපනම් බද්දෙන් නිදහස් කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**03.6 <u>වරිපනම් ගෙවීම නිදහස් කරදෙන ලෙස ඉල්ලීම.</u>**

203, උරුලැමුල්ල, අලව්ව ලිපිනයේ ජේ.ඒ. චමිලා ප්‍රියදර්ශනී ජයකොඩි මහත්මිය විසින් ඉදිරිපත්කර ඇති ලිපියට අනුව ගිරිඋල්ල දකුණ 516/A උළු සෙවිලි නිවස සඳහාද 516 යන අත්තිවාරම සඳහාද 516/B යන තහඩු සෙවිලි කල පැල තවාන සඳහාද වරිපනම් පෝරම ලබා දී ඇති බවත් එහි අංක 516, ඉඩම ලෙස සඳහන් කල නමුත් අත්තිවාරම සඳහා තක්සේරු කල බවත් එම අත්තිවාරම දැන් ඉවත් කර ඇති බවත් එසේම 516/B යන පැල තවාන ද දැනට වසර 04 කට පෙර ඉවත් කර ඇති බවත් ඉහත කොටස් 03 ම එකම ඉඩමක පිහිටා ඇති බවත් දන්වමින් ඉවත් කරන ලද කොටස් දෙක සඳහා වරිපනම් ගෙවීම නිදහස් කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. එමෙන්ම ආදායම් පරීක්ෂක වාර්තාවට අනුව 516/B යන පැල තවාන සහ 516 යන වරිපනම් දේපල වන අත්තිවාරම ඉවත් කර ඇති බවත් එබැවින් 516/Aහා 516/B යන දේපල තක්සේරු ලේඛනයෙන් ඉවත්කිරීම සුදුසු බවත් 516 ලෙස එක් වරිපනම් අංකයක් පමණක් ලබා දීම සුදුසු බවත් දන්වා ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඇවිල්ල තමයි මේ තක්සේරුව කරන්නේ. ඊට පසුව ආදායම් පරික්ෂක මහතා මුදල් අය කරන්න ගියාම එතුමා අපහසුතාවයට පත් වෙනවා. ආදායම් පරික්ෂක මහතා ස්ථාන පරික්ෂාවක් සිදු කරලයි මේ වාර්තාව දාලා තිබෙන්නෙ. ඒ අනුව 516 ලෙස පමණක් වරිපනම් අංකයක් ලබාදිම සුදුසුයි කියල යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී** ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 203, උරුලැමුල්ල, අලව්ව ලිපිනයේ ජේ.ඒ. චමිලා ප්‍රියදර්ශනී ජයකොඩි මහත්මිය හට 516 ලෙස එක් වරිපනම් අංකයක් පමණක් ලබාදීම සුදුසු බවට තීරණය විය.

**03.7 <u>රාජ්‍ය වියදම් පාලනය කිරීම හා රාජ්‍ය සම්පත් අවභාවිතය වැලැක්වීම.</u>**

රාජ්‍ය වියදම් ඉතාම අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා පමණක් යොදාගත යුතු බවත් අප ආයතනයට අදාල සංවර්ධන ව්‍යාපෘතීන් සිදු කිරීමේදී මැතිවරණ කාලසීමාවේදී මැතිවරණ නීති උල්ලංඝනය නොවන අයුරින් කටයුතු කල යුතු බවත් තරයේ අවධාරණය කරමින් සහ අප ආයතනයේ අයවැයෙන් සම්මත කරන ලද වාර්ෂික සැලැස්මට අනුව මේ වන විට සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් තාවකාලිකව නවත්වන ලෙසත් සම්මත වූ වාර්ෂික සැලැස්ම පළාත් පාලන කොමසාරිස්තුමා වෙත එවන ලෙසත් එතුමාගේ අනුමැතිය මත අත්‍යාවශ්‍ය සංවර්ධන ව්‍යාපෘතීන් සිදු කිරීමට කටයුතු කරන ලෙසත් දන්වමින් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අංක ව/පපාදෙ/01/01/මැති/පොදු හා 2023.01.25 දිනැතිව යොමු කර ඇති ලිපිය.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔය සම්බන්ධව කලින් ඉදල දැනුවත් කලත් මම නම් දැක්කෙ නෑ ඔය කියන සීමාවන් යටතේ කටයුතු වෙනවද කියල. මේ මැතිවරණයකට මුහුණ දෙන මොහොතේ අපේ

ප්‍රදේශවලත් ඒ සංවර්ධන කටයුතු සිදු වෙනවා. ඒවා කිසිම ප්‍රමිතියකට අනුවත් නොවෙයි සිදු වෙන්නෙ. මුදල් වෙන් කරල තිබෙන පාරවල් නම් කරල තිබ්යදීත් ඒ පාරවල් වලට අමතරව තැන් තැන් වල වැඩ කටයුතු සිදු වෙනවා. වඩුවාවේ සුසාන භූමිය පාර මේකෙ නෑ. නමුත් ඒ පාරේ බොරළු දාල තිබෙනවා මේ ලිපියේ ආකාරයට මේවා වෙනවානම් කාටවත් අසාධාරණයක් වෙන්නේ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔය චක්‍රලේඛ සම්බන්ධයෙන් අපි සැලකිලිමත් වෙන්න ඕනෑ. යම් කිසි විදියකින් අපේ බල ප්‍රදේශයේ යම් සංවර්ධනයක් කරන්න පුළුවන් නම් ඒ චක්‍රලේඛවලට අනුකූලව ඒ කටයුතු කරනවනම් හොඳයි කියන ඒකයි මගේ අදහස. මම කියන්නේ මේ මන්ත්‍රීවරයෙකුගේ යුතුකම තමා මේ බල ප්‍රදේශයේ කුමන හෝ සංවර්ධනයක් කරන්න පුළුවන්නම් ඒක තමයි වැදගත් වෙන්නේ. අපි අනුමැතිය අරගෙන ඒ වැඩ කටයුතු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, රාජ්‍ය වියදම් පාලනය හා රාජ්‍ය සම්පත් අවභාවිතය වැලැක්වීම මත අත්‍යාවශ්‍ය විශේෂ දේවල් කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව සිදුකරන්න අවසරය දිලා තිබෙනවා. විශාල ජනතාවක් පරිහරණය කරන මේ මාර්ගය ප්‍රතිසංස්කරණය කරන්න කොමසාරිස්තුමාගෙ අනුමැතියට යටත්ව සිදුකරන්න අවස්ථාව දීල තිබෙනවා. විශේෂයෙන්ම මේ සභාවෙ කවුරු හෝ යෝජනාවක් ගේනවා නම් ඒ අත්‍යාවශ්‍ය මාර්ගයක් තමයි පළමු තැනට කරල තිබෙන්නේ. ඒ වගේ දේවල්වලට ප්‍රවේශ වෙන්න කඩඉම තියල තමයි මේ චක්‍රලේඛය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම අපේ සභාවේ මහජන නියෝජිතයන් අයවැයට යෝජනාවක් දීල ඒ දීපු යෝජනාව නම් මේ අන්තර්ගත වෙලා තිබෙන්නෙ ඒක දීම සම්බන්ධව මේකේ කොතනකවත් බාධාවක් පෙන්වලා නෑ. කොමසාරිස්තුමාගෙ අවසරය අරන් තමයි අවසාන මොහොතෙ ඒ කටයුතු කරන්න අපට අවස්ථාව ලැබුණේ. මහජන නියෝජිතයො හැමවෙලේම ගේන්නෙ මහජනතාවගේ යෝජනා. ඒ නිසා මේ චක්‍රලේඛ අනුව කටයුතු කිරීම සුදුසු බවට මේ සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ චක්‍රලේඛ අපි කැමති වුනත් අකමැති වුනත් අපට බැහැර කරන්න බෑ. ජනවාරි 25 නැවත චක්‍රලේඛයක් ගහල තිබෙනවා. අත්‍යවශ්‍ය වැඩ අපි කරන්න ඕනෑ. මේ චක්‍රලේඛ පිළිබඳ සැලකිලිමත්ව අපි වැඩ කරමු කියන එක මම මතක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගිය වසරේ අවසාන කාලෙ ආපදා කාලසීමාවේ මාර්ග විශාල ප්‍රමාණයක් විනාශ වෙලා තිබුණා. ඕතර කිරුවන්පොල මාර්ගය යන්න එන්න බැරි තත්වයට පත්වෙලා. ඒ නිසා එම මාර්ගය ඉතා ඉක්මනින්ම සංවර්ධනය කරගත යුතුව තිබෙනවා. ඒ සම්බන්ධව ලිපි ඉදිරිපත් කරල තිබෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මන්ත්‍රීතුමා ඉදිරිපත් කල යොජනාවේ ජලනල එලීම නිසා පාර දෙපැත්ත කැඩිල ආපදා අවස්ථාවේ එම ආපදාවලට ප්‍රමුඛතාව දෙන්න අපට සිදුවුණා. ඔබතුමාල අයවැයට ඉදිරිපත් කල යෝජනාවලට වඩා ප්‍රමුඛතාව දිය යුතු ස්ථාන තිබෙනවානම් සංශෝධන විදියට ඉදිරිපත් කරන්න අපි මේ තොරතුරු යවනකොට සැලැස්මයි අයවැය ලේඛනයයි දෙකම බලනවා. මේ පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ර්.එම් නිහාල් ඒකනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

ඉහත කාරක සභා අවස්ථාවේදී කොමසාරිස්තුමා විසින් යොමු කරන ලද රාජ්‍ය වියදම් පාලනය කිරීම හා රාජ්‍ය සම්පත් අවභාවිතය වැලැක්වීම සම්බන්ධ චක්‍රලේඛය පිළිබඳව හා ඒ අනුව 2023 වසරේ පලමු කාර්තුව තුළ ක්‍රියාත්මක කළ යුතු යැයි සංවර්ධන සැලැස්මේ ඇතුලත් සංවර්ධන යෝජනා පමණක් පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමු කිරීම සිදුකිරීමෙන් අනුමැතිය ලැබෙන බවට ලේකම්තුමිය විසින් පැහැදිලි කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2023 අයවැයෙන් වෙන් වෙලා තිබෙන පරිදි සියලුම මන්ත්‍රීවරුන්ට තමන්ගේ ලැබෙන මුදල අනුව එක යෝජනාවක් මහා සභාව අනුමත කරලා පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යැවීමට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මන්ත්‍රීවරු සියලු දෙනාම මැතිවරණයකට මුහුණ දීලා සිටින වෙලාවක්. හැම කෙනාම බලන්නේ තමන්ගේ කොට්ඨාශයට වැඩක් කරන්න. දැන් අයවැය ලේඛනයේ තිබෙන යෝජනා එක්ක සංසන්දනය කරලා බලනවා නම් මේ මන්ත්‍රීවරු හතර දෙනෙක්ට තමයි ප්‍රතිපාදන ලැබෙන්නේ. අනිත් කවුරුත් අයවැයට යෝජනා දීලත් නෑ. ඒක මන්ත්‍රීවරුන්ගේ වරදක් තමයි. ඒ වුණත් ඒකට යම් ක්‍රමවේදයක් අපි හදන්න ඕනෑ. අපි ඒ තොරතුරු යවන්න ඕනෑ.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2023 මහජන නියෝජිතයො හැම දෙනාගෙම යෝජනා නෑ කියන එක හරි. නමුත් 2022 අයවැය ලේඛනයේ හැමෝගෙම යෝජනා තියනවා. එහෙම නම් ණයහිමි යටතේ 2022 අපි ඉදිරිපත් කරපු යෝජනා යොමු කිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඒ මන්ත්‍රීතුමන්ලා 2022 දීලා තිබෙන අත්‍යාවශ්‍ය යෝජනා දාන්න, අපේ 2023 යෝජනා දාන්න. මම "බෝයවලාන ගල්ගමුව මාර්ගයේ බෝයවලාන මධ්‍යම බෙහෙත් ශාලාව දක්වා ඇති ඉතා අබලන්ව ඇති කොටස සංවර්ධනය කිරීම" මගේ යෝජනාව ලෙස ඉදිරිපත් කරනවා.

**03.8** **<u>බුජ්ජොමුව වඩු කොහු කර්මාන්ත පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම.</u>**

අංක 1018 බුජ්ජොමුව ග්‍රාම නිලධාරී වසමේ අනුරේඛන අංක 2013/46 හි කැ.අ. 48 හි හෙක්ටයාර 0.1156 ක් වන වඩු කොහු කර්මාන්තය පිහිටි ඉඩම වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සඳහා එකඟතාවය ලබා දෙන ලෙසට 2022.10.31 දිනැති ලිපියෙන් වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙතින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කර ඇති බවත් ඒ සඳහා එකඟතාවය ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අංක කු/අල/ඉ/2/1/122 හා 2023.01.11 දිනැතිව යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අතීතයේ කොහු කර්මාන්ත ශාලාවක් ඔතන තිබුණා. ඒ වගේම යාන්ත්‍රික වඩු පාසලකුත් ඔතන තිබෙනවා. මේ වන විට කොහු කර්මාන්ත ශාලාව ඔතන නෑ. ඒ භූමියේම තිබෙනවා සායන මධ්‍යස්ථානයක්. අපි තීන්දු කරන්න ඕනෑ සායන මධ්‍යස්ථානයත් එක්කම මේක තිබෙනවද කියලා. අපි දැනගන්න ඕනෑ මෙතන තිබෙන්න ඕනෑ වඩු කර්මාන්තශාලාවද, කොහු කර්මාන්තශාලාවද කියලා. වඩු කර්මාන්ත ශාලාවේ නම් කිහිපදෙනෙක් වැඩ කරනවා. ඒවගේම ඔය ඉඩම කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවට පවරලා දුන්නොත් සායන මධ්‍යස්ථානයට ගැටළුවක් වෙන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මන්ත්‍රීතුමා කියන කාරණාව පිළිබඳව අපි බොහොම සැලකිලිමත් විය යුතුයි. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව තමයි මේක ඉල්ලන්නේ. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයිති සායන මධ්‍යස්ථානයක් තමයි තිබෙන්නේ. කොහු කර්මාන්තය තිබුන තැන දැන් සිදුවෙනවා ඇත්තේ සායන මධ්‍යස්ථානයේ කටයුතු වෙන්න ඇති. ක්‍රියාත්මක වෙමින් යන එක තිබෙද්දි ක්‍රියාත්මක නොවෙන එකකට අපි ඉඩම පවරලා දුන්නොත් ගැටළුවක් ඇති වේවි. අපි අර්බුද නිරාකරණය කර ගන්න ඕනෑ වෙලාවක නැවත අර්බුද හදනවනම් ඒක ගැටළුවක්.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

සභාවේ එකඟතාවය ලබා දෙන්න කියලා ඉල්ලා තිබෙන්නෙ ප්‍රාදේශීය ලේකම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අදටත් වඩු ඉස්කෝලෙ ළමයි ඉන්නවා. ඒ වගේම සායන මධ්‍යස්ථානයත් එතන ක්‍රියාත්මක වෙනවා. මේ ආයතන දෙකම එකතුවෙලා සාකච්ඡා කරල මේ දෙකටම ගැලපෙන ආකාරයට ඒ අයට කටයුතු කරන්න පුළුවන්නම් ගැටළුවක් මතු වෙන්නෙ නෑ. ඔබතුමිය මේ සම්බන්ධව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් භාරව

සිටින නිලධාරින් සමඟ සාකච්ඡා කරල ඒ ආයතන දෙකටම ගැටළුවක් නොවෙන ආකාරයට මේ ගරු සභාවට යෝජනා කරලා එය ස්ථිර කලා කියල එතුමියව දැනුවත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සායන මධ්‍යස්ථානය අත්‍යවශ්‍යයි. ඒ බව ප්‍රාදේශීය ලේකම්තුමියට දන්වන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය ලේකම්තුමිය ගැන කතා කරනවිට එතුමිය කටයුතු කරන්නෙ මහජන නියෝජිතයො ගැන තැකීමකින් තොරවයි. බෝයවලාන පොලීසිය සෑදීමේදී පවා එතුමිය කටයුතු කලේ එතුමියගෙ තනි තීරණයකට. පවුල් 600 ක විතර ජනතාව රැස්වීම් පවත්වපු තැන, රාජ්‍ය නිලධාරින් හමුවීමට තිබුණ තැන තමයි එතුමිය අහිමි කලේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය ලේකම්තුමිය අවසරය දීලා තිබෙන බව අපි දැනගත්තෙ පස්සේ. ප්‍රාදේශීය සභාව ගැන කතාවක් නෑ. එතුමියගෙ බලතල වලට ගමේ මිනිස්සුන්ට දෙන්න යන්නෙත් බෝයවලාන පොලීසිය පිටුපස්සෙ පොඩි කෑල්ලක්. තව කාරණයක් දැනගන්න කැමතියි. කැප්පිටිවලාන උප කාර්යාලය සම්බන්ධයෙන්. ඒකෙ අයිතියක් අපට නැද්ද? අපි සාමාන්‍යයෙන් ගමක වැඩක් කරනවනම් ඒක රජයට පවරලා දෙන්න ඕනෑ. එතකොට මෙතෙක් කල් අපි සංවර්ධන කටයුතු කලේ කොහොමද. ප්‍රාදේශීය සභාවට අයිතියක් නැත්නම් අපි ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් අවසරයක් ගන්න අවශ්‍ය වෙනවා. එදා ඉදල තිබුණ උප කාර්යාලය එතකොට සභාවට කිසිම අයිතියක් නෑ.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේකේ මුල ඉදලම වරදක් සිදුවෙලා තිබෙනවා. 1948 න් පස්සෙ පහළම මට්ටමේ සිටින කෙනා තමයි ප්‍රාදේශීය සභා මන්ත්‍රී. ජනාධිපති පාලනයේ ඉදල වර්තමාන දේශපාලන තන්ත්‍රය මොකක්ද කියල රාජ්‍ය නිලධාරින් චක්‍රලේඛ මඟින් හරි දැනුවත් වෙන්න ඕනෑ. අද ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු 1987 ට කලින් ගම්සභා නියෝජිතයෝ. ඊට පසුව තමයි මන්ත්‍රී වුණේ. මන්ත්‍රී කියන එක ගෞරවනීය නාමයක්. ඒ අය තමයි ජනතා නියෝජිතයෝ. දැන් මේ ලිපියේ තිබෙන ආකාරයට ප්‍රාදේශීය ලේකම්ගෙන් තමයි අවසරය ගන්නේ. වක්‍රාකාරයෙන් අපෙන් අහනවා මේකට අවසර දෙනවද කියලා. මේකට අනුමැතිය දෙන්න එපා. බෝයවලාන සිද්ධියත් අපෙන් අහන්නේ නැතිව කල නිසා තමයි ඒ ගැටළුව තිබෙන්නේ. සභාවක්, මහජන නියෝජිතයෙක් කියන්නෙ මේ බල ප්‍රදේශයේ යෝජනා හා අනෙකුත් ක්‍රියාමාර්ග ගන්න පුළුවන් අය. ඒ අවස්ථාව නැති නිසා තමයි මේ හැම ආයතනයක්ම අපට හොරා ගිහිල්ලා බැරිවෙනකොට අපෙන් අහන්නේ. ඒ නිසා මේ කටයුත්තට අපි විරුද්ධයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ සායන මධ්‍යස්ථානයට ගැටළුවක් නොවිය යුතුයි. ඒ වගේම ප්‍රාදේශීය ලේකම්තුමියගේ භූමිකාවත් එක්ක මතුවුන ගැටළුවක් තිබෙනවා. කප්රුක සමිති ශාලා ගොඩනැගිල්ලක් තිබෙනවා. භූමිය අයිති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. ඒක තිබෙන ගොඩනැගිල්ල දිරාපත් වෙමින් යනවා. ගමේ රාජ්‍ය නිලධාරීන් හතර දෙනා හතර කොනක ඉන්නවා කුලී ගෙවාගෙන. ප්‍රාදේශීය ලේකම්තුමිය මේ ගැන දැනුවත් කිරීමක් කරනවා නම් වඩාත් හොදයි. ඒ

ස්ථානයේ  රාජ්‍ය නිලධාරීන් හතර දෙනාට ඉන්න පුළුවන් විදියට සකස් කරනවා නම් හොඳයි. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

බෝයවලාන ගැටලුව ගත්තම අපි ඒ කොටස ඉල්ලුවේ නිල පියස හදන්න කියලා. ඔය නිලධාරි ඔක්කොම ඉන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් යටතේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තමන් යටතේ ඉන්න නිලධාරීන්ගේ අවශ්‍යතාවය කොහොමද ඉෂ්ඨ කරල දෙන්නේ කියලා සිතා බැලිය යුතුයි. තමන්ගේ නිලධාරීන්ගේ අවශ්‍යතාවය ඉටු කරල අනෙක් කොටස පොලිසියට ලබාදෙන්න ඕනෑ. අද මේ ප්‍රශ්නෙත් තියෙන්නේ ඒ වගේ දෙයක්. මේ වඩු කර්මාන්තයට ඒ කාලෙ කිව්වෙ වඩු ඉස්කෝලේ කියලා. මෙයින් හොඳ වෘත්තීය පුහුණුවක් දුන්නා. මේකේ තුන් හතර දෙනයි ඉන්නවා කියන්නේ. ඒ ස්ථාන තියෙන්න ඕනෑ ඒවාට ගැලපෙන තැන්වල. අහල පහල ඉන්න කීප දෙනෙක් එනවා මිසක් දුර ඉන්න අය එන්නේ නෑ. මෙම ස්ථානයෙන් වැඩි ප්‍රයෝජනයක් ගන්නේ සායන මධ්‍යස්ථානයෙන් කියන එක කවුරුත් දන්නවා. අපි මීට පෙරත් මේ ප්‍රශ්නය ගැන මේ සභාවේ කතා කලා.

ඊළඟ ප්‍රශ්නය තමයි කැප්පිටිවලාන උප කාර්යාලය තිබෙන ඉඩම. ඒ ඉඩම පවරාගැනීමට මම ආවට පස්සෙත් ලිපි හැදුවා. ස්ථානභාර නිලධාරීත් විස්තර හොයලා එවලා තිබුණා. RD එකෙන් කියලා තියෙනවා RD එකට ඒකේ අයිතියක් කියන්න දෙයක් නෑ. මේ වෙනකොට එය පවරාදීමේ කටයුතු  ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදුවෙනවා.

දැන් වල්දොළුවත්ත වැවට අයිති පාර ලියාපදිංචි කරලා දෙන්න කියලා ඉල්ලීම් තිබෙනවා. අද මම විරුද්ධ වුණත් මත්ස්‍යයන් ඇති කිරීම අද හැමතැනම කෙරෙන ව්‍යාපාරයක්. ඒ කටයුතු ගොවි සමිතිවලට බාරදීලා තියෙනවා, ඒවගෙන් යම්කිසි ආදායමක් ලබා ගන්න. එතකොට කාගෙවත් ගෙවල් අස්සෙන් යන්න බෑ. ඒ නිසා වැවට යන්න තිබෙන පාර සංවර්ධනය කලාට කමක් නෑ. නමුත් ඒකත් මැනුම් වලට යවලා තිබෙනවලු. ඒ ආවම තමයි නිදහස් කරන්නේ කියලා තිබෙනවා. මේ කොට්ඨාශයක් තුල දේශපාලන අධිකාරියක් හැදෙනවා, විවිධ බලතල තිබෙනවා. අපිට පුළුවන් සීමාවේ මේ සභාවට යන්න පුළුවන් උපරිම තැන් වලට ගිහිල්ලා දැනුවත් කරලා තිබෙන්නේ. එතනින් එහාට තීන්දු තීරණ නොගැනීම මොකක්ද කියන එක දන්නෙ නෑ. නමුත් මේ කාරණා තුන ගැනම අපට ගන්න පුළුවන් උපරිම ක්‍රියාමාර්ග ගමු. අද සභාවේ වඩු, කොහු කර්මාන්තය සම්බන්ධ ගැටලුව සම්බන්ධව වෛද්‍ය සායනයට හානියක් නොවන පරිදි මේ දෙපාර්තමේන්තු දෙකේ ආයතන දෙකක් බැවින් කාටත් අවහිරයක් නොවන පරිදි බෙදා වෙන්කර පැවරීම සුදුසුයි කියලා අපි තීන්දු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, රාජ්‍ය ආයතන දෙකක් නිසා ඒ රාජ්‍ය ආයතන දෙකටම පවරලා දෙන්න කියලා එතුමියව දැනුවත් කරන්න.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මාසෙකට සැරයක් සංවර්ධන කමිටු තියෙන විට ඔය ආයතන දෙකේම නිළධාරීන් එනවා. එතනදී මේ ප්‍රශ්නය ඉදිරිපත් කලා නම් මන්ත්‍රීවරුත් ඉන්නවා. ලේසියෙන් තීන්දුවක් ගන්න පුළුවන්.

ඒ අනුව ඉහත ඉඩම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ එකඟතාවයන් ලබාගැනීමෙන් අනතුරුව වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය ලබාදීම සුදුසු බවට සභාවේ ඒකමතිකව තීරණය විය.

**03.9 තක්සේරු ලේඛනයෙන් අංකය ඉවත් කිරීම සම්බන්ධව.**

තක්සේරු ලේඛනයේ පී.බී. වැත්තැව ලෙස නම සඳහන් ගිරිඋල්ල පාර දකුණ අංක 284 දරණ දේපළ මේ වන විට බස්නැවතුම්පලක් පමණක් දක්නට ලැබුනු බවත් වෙනත් ඉඩමක් නිරීක්ෂණය නොවුනු බවත් ගිරිඋල්ල පාර දකුණ අංක 284/6 දරණ දේපලක් ද නොමැති බවට නිරීක්ෂණය වූ බවත් එබැවින් එම ගිරිඋල්ල පාර දකුණ අංක 284 හා අංක 284/6 යන දේපල දෙක තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවත් දන්වමින් ආදායම් පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

පී.බී. වැත්තැව කියන නම දාපු බෝඩ් එකක් ගහලා තියෙන නිසා වෙන්න ඇති අපට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කරලා එවලා තියෙනවා. නමුත් අපට එහෙම දේපලක් නැහැ. ඔබට පේනවා ඇති මේ පාරට හැරෙන තැන දකුණු පැත්තේ බුදු මැදුරක් ඉදි කරලා තිබෙනවා. බස් නැවතුම්පොලක් හදලා තිබෙනවා. ඒත් ඒක්කම තිබෙන්නේ ප්‍රධාන පාරට අවතීර්ණ වන තැන. ඉතින් අපිට අයිති නැති දේපලකට අපට අයිතිවාසිකම් කියන්න අවශ්‍ය නැහැ. මේ ලිපිය ඉල්ලලා තිබෙන්නේ එහෙම දේපලක් නැති නිසා මේ තක්සේරු අංක ඉවත් කරන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම ස්ථානයේ බුදු මැදුරක් හදලා තිබෙනවා. ඒ ළඟම බස් නැවතුම්පොලක් තිබෙනවා. ඒ හැරුණම එතන ගොඩනැගිල්ලක් නෑ කියන එක ආදායම් පරීක්ෂක මහතා විසින් සහතික කරගෙන  තිබෙනවා. ආදායම් පරීක්ෂක මහතුන් ගම්වලට ගිහිල්ලා ආදායම් හොයන්න ගියාම තමයි ගෙදර අය කොස්ස ඉදල අරන් එන්නෙ මගෙ නැති දේපලකට ඇයි වරිපනම් හදන්නේ කියලා. මේවා නිවැරදි වෙන්න ඕනෑ. එහෙම නැත්නම් සභාවේ නිලධාරියා තමයි ප්‍රශ්නවලට මුහුණ දෙන්නේ. ඒ නිසා මේ දේපල තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා. මේ වගේ ලොකු ප්‍රශ්න තිබෙනවා නම් ඒවා ඉක්මනින්ම නිවැරදි කරගත යුතු වෙනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

සාමාන්‍යයෙන් වරිපනම් ගෙවන අය දන්නවා මේ තක්සේරු දෙපාර්තමේන්තුවේ අය තක්සේරු කරන්න යනකොට සභාවේ නිළධාරියෙකුත් ඒ අයත් එක්ක යන්න ඕනෑ. මම යෝජනා කරනවා ඉදිරියේදී එලෙස සහභාගී වෙන්න කියලා. කලින් එම දේපල හඳුනා ගැනීම මේ තක්සේරු නිලධාරී එක්ක යන අයගෙ වගකීමක් වෙනවා. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඒ තක්සේරු ලේඛන එව්වාට පස්සේ සභාවේ නිලධාරීන්ට සභා වාහනයක් දීලා හරි  තක්සේරු දෙපාර්තමේන්තුවෙන් එවන ලද ලේඛනයක් එක්ක අපේ අය යවලා මේවගේ නිවැරදිභාවය තහවුරු කරගෙන, අපි ලියුමක් යවන්න ඕනෑ තක්සේරු එකට ඒවා හරි හෝ වැරදියි කියලා. දැන් මෙහෙ සතියකට සැරයක් කමිටුවක් පවත්වනවා වරිපනම් ලේඛන නම් වෙනස් කිරීම කියලා. වරිපනම් ගෙවන පුද්ගලයෝ තමන්ගේ වැඩ නවත්වලා ලියුම් හදාගෙන ඇවිල්ලා මේ කමිටුවට ඉදිරිපත් කරන්න ඕනෑ නිවැරදි කිරීම් සඳහා. ඒ නිසා මම යෝජනා කරනවා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු ලේඛනය එව්වාම  අපේ නිළධාරීන්ට වාහනයක් දීලා හරි ඒ ටික පරීක්ෂා කරලා බලලා නිවැරදි තීන්දුවකට එනවානම් හොඳයි කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරන අතර ඔබතුමිය අදහස් ප්‍රකාශ කලාට පසුව මටත් අදහසක් ආවා අපේ තක්සේරු ලේඛන තිබෙනවා . ඒවත් නැවත පරීක්ෂා කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ගිරිඋල්ල පාර දකුණ වරිපනම් අංක 284 හා අංක 284/6 යන දේපල දෙක තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**03.10 <u>ජලය ලබා ගැනීම සම්බන්ධව.</u>**

සභාවත්ත, පරමාඋල්ල, අලව්ව ලිපිනයේ පදිංචි ක්‍රිෂ්ණා කුමාරි මිය විසින් ජල සම්පාදන මණ්ඩලය මගින් ජලය ලබා ගැනීමට අදහස්කර ඇති බවත් අප සභාව මගින් ඇය ඒ සඳහා සුදුසු බවට සහතික කිරීම අවශ්‍ය වන බවත් දන්වමින් ලිපියක් යොමු කර ඇති අතර විෂය නිලධාරී විසින් ඇය සභාවත්තේ පදිංචි බවත් එමෙන්ම මෙම ඉඩමෙහි පදිංචි කරවන ලද අප සභාවේ සේවක මහතුන්ද ජල සම්පාදන මණ්ඩලය මගින් ජලය ලබාගෙන ඇති බවත් වාර්තා කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ සභාවේ වැඩ කරන සේවක මහතුන්ටයි, බස් නැවතුම සංවර්ධනය කරන අවස්ථාවේ එතන හිටිය ජනතාවටයි තමා බණ්ඩාර වැත්තෑව සභාපතිතුමාගෙ කාලේ මේ සභාව සතුව තිබුන ඉඩමේ මේ අයට ඉන්න අවස්ථාව ලබා දුන්නේ. ඒ වගේම ප්‍රදේශයේ මරණාධාර සමිතියක් තිබෙනවා. කරුණා ජයමහ කියලා කෙනෙක් ඉන්නවා. එතුමා ඉල්ලීමක් කලා ඒ වෙලාවේ සභාවෙන් සමිති ශාලාවක් හදා ගන්න භූමියක් ලබා දෙන්න කියලා. ඒ භූමියත් ඒ වෙලාවේ ලබා දුන්නේ එකඟතාවය ලැබෙයි කියලා මේ සභාවේ සේවකයෝ නිසා. නිවාස සංවර්ධන අධිකාරියෙන් ණය මුදලක් ලබා ගන්න ගියාම කියනවලු ඔප්පුව නැතුව ණය මුදල දෙන්න බෑ කියලා. මේ ගරු සභාවෙන් අපි හිටපු සභාපතිවරුන්ට කථා කරලා ලේකම්වරුන්ට කථා කරලා මේ සභාවෙන් ලියුමක් දෙනවා මේ පත්ඉරු සඳහා අවසර ලබා දෙන්න කියලා. නමුත් ඔප්පුවක් දෙන්න බෑ. ඒ මත දරුවා පාසලට ඇතුලත් කිරීම වගේම නිවාස ණය ලබාගැනීමට නිවාස සංවර්ධන අධිකාරියට ගැටළුවක් නෑ. හැබැයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මේ පුද්ගලයෙකුට කවදාවත් අපේ සේවකයෝ මාර්ග සුද්ධ කරන කට්ටිය, අර මිනිස්සුන්ට අර නිවාස සංවර්ධන අධිකාරියේ අඩු පොලී සහිත ප්‍රදානය දෙන්නෙත් නෑ. දැන් වතුර ඉල්ලලා මේ කාන්තාව ඉල්ලීමක් කරලා තිබෙනවා නම් ඇයට පමණක් නෙමෙයි එහි සභාව විසින් පදිංචි කරන ලද සභාවේ එකඟතාවය මත බස්නැවතුම්පොල නවීකරණය කිරීමේදී ඉවත් කරන ලද පවුල් ඇතුළුව පදිංචි කරවන ලද සභාවේ සේවක මහතුන් මෙන්ම යම් යම් අය පදිංචි වෙලා ඉන්නවා නම් ඒ සියළුම අය සඳහා වතුර ලබා දීම ඔය කරලා තිබෙන ඉල්ලීම මත ලබා දීම සුදුසු බව මම යෝජනා කරනවා. එම කාන්තාවගේ මූලික අයිතිවාසිකමක් හැටියට ඇය කරන ඉල්ලීම අනුව ඇයට ජලය ලබා දීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව සභාව විසින් සභාවේ එකඟතාවය මත බස්නැවතුම්පොල නවීකරණය කිරීමේදී ඉවත් කරන ලද පවුල් ඇතුළුව පදිංචි කරවන ලද සභාවේ සේවක මහතුන් සහ සභාවේ අනුමැතිය මත පදිංචි කරවන ලද සියළුම අය සඳහා වතුර ලබා දීමට සුදුසු බවත් ඉහත නම් සඳහන් අය වෙතද ජලය ලබා දීමටත් සභාවේ එකඟතාවය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**03.11** <u>**අලව්ව බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානයේ යෝජිත සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීම.**</u>

අලව්ව බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානයේ ඉදිරි සංවර්ධන කටයුතු සිදු කිරීම දායක සභාව හා ප්‍රදේශවාසී බෞද්ධ ජනතාව බලාපොරොත්තු වන බැවින් ජනතාවට වන්දනාමාන කිරීමට පහසුකම් සලසා දීම සඳහා අවශ්‍ය ආකාරයෙන් සංවර්ධන කටයුතු සිදු කිරීමට අවසරය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් සහ ඇස්තමේන්තුව, සැලැස්ම ඉදිරියේදී ලබාදීමට කටයුතු කරන බවත් දන්වමින් අලව්ව බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානය නුගවෙල ශ්‍රී නිග්‍රෝධාරාමය උභය විහාරාධිකාරී සාම විනිසුරු පූජ්‍ය මුංවත්තේ වංසානන්ද හිමි, බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානය, කුරුණෑගල පාර, අලව්ව විසින් ඉදිරිපත්කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පළමුවෙන්ම කියන්න ඕනෑ බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානය රාහුල පිරිවනේ නායක හාමුදුරුවෝ යටතේ පවත්වාගෙන ගියේ මේ විහාරස්ථානයට අනෙක් පසින් ඉඩමේ අයිතිය තිබෙන්නේ රජයට. ඒ කොටසේ තමයි දැන් මීරිගෙලිය රේල් පාර අයිනෙ පදිංචි පුද්ගලයො පදිංචි වෙලා හිටියේ. රත්නායක සභාපතිතුමා තමයි ඒ කාලේ හිටපු සභාපති. එතුමාටත් ලොකු බලාපොරොත්තුවක් තිබුණා එම කොටසේ නාගරික රුක් ගොමුවක් ඇති කරන්න. නමුත් අර පුද්ගලයො නඩුවකට ගිය නිසා ඒක කරගන්න හැකියාවක් ලැබුණේ නැහැ. ඒ අයත් එක්ක සභාව තමා නඩු කීවේ. නඩුව අවසානයේ එවකට හිටිය මහේස්ත්‍රාත්වරයා තීන්දුවක් දුන්නේ මේ පවුල්වලට ඉන්න සුදුසු ස්ථානයක් ලබා දෙන තෙක් ඉවත් කල නොහැක කියලා. සුමිත් රාජපක්ෂ මැතිතුමා සභාපති වෙලා නාරම්මල සභාවේ ඉන්න කොට මහ ගංවතුරක් ඇවිල්ලා සම්පූර්ණයෙන් යටවුන අවස්ථාවේ අපි ඒ අය වලකුඹුරට ගෙනිහින් එතනින් මීරිගෙලියට රැගෙන ගියා. ඒ කාලේ අපි සභාවෙන් ගත්ත තීරණයක් තිබුණා රජයේ ඉඩම් බෙදා දෙන වැඩසටහනක් තියන විට ඒවට මේ තෙක් තාවකාලිකව මේ රේල් පාර අයිනේ මෙයාලට ඉන්න අවසර දෙන්න කියලා. එහෙම කරලා අපි ඉඩම නිදහස් කර ගත්තා. ඒ අතරෙ ඔබතුමිය සභාපතිතුමිය කාලේ මම වෙළඳ සංගමයේ සභාපති. එවකට නාගරික කොමසාරිස්තුමා මෙහෙට ඇවිල්ලා ඉල්ලීමක් කලා නාගරික රුක් ගොමුවට ඉඩමක් ලබා දෙන්න කියලා. පසුව යහපාලන ආණ්ඩුව කාලෙ මේ විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ අගමැතිතුමා හමුවෙලා මේ විහාරස්ථානයට යන්න පාරක් ඉල්ලුවා. ඊට පසුව අගමැතිතුමා මාව කැඳවලා ඇහුවම මම කීවා මේ ඉඩම ප්‍රාදේශීය සභාව තමයි නිදහස් කර ගත්තේ. අපි මේක නාගරික රුක් ගොමුවක් සහ වොෂ් රූම් එකක් හදන්න කොමර්ෂල් බැංකුව ඉස්සරහා පාරෙන් අනිත් පැත්ත තියාන ඉන්නෙ කියලා. ඊට පසුව අගමැතිතුමා නියෝගයක් දුන්නා කොමර්ෂල් බැංකුව ඉස්සරහා ඇති ඉඩමට හානියක් නොවන ආකාරයට නාගරික සීමාවට ලංවන හරියෙන් පාරක් පමණක් උන්වහන්සේට ලබා දෙන්න අලුත් පාලම යටින්. එම මාර්ගය විහාරස්ථානයට පැමිණෙන දායකයින්ට පරිහරණය සඳහා පමණයි. එයින් දෙපැත්තෙ ඇති ඉඩම්වල නිසි බලධාරියා ප්‍රාදේශීය සභාව විය යුතුයි කියලා. ඒ අනුව සභාවේ දේපලවලට කිසිදු හානියක් නොවන ආකාරයට මේ අවශ්‍ය කරන අනුමැතිය ගන්න කියලා. උන්වහන්සේ කරල තිබෙන ඉල්ලීම හොඳ ඉල්ලීමක්. උන්වහන්සේගේ ආගමික සිද්ධස්ථානය ඉදිකරලා ඒ සීමාව තුළ සංවර්ධන කටයුතු පවත්වාගෙන යාම සුදුසු බවට මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, විපක්ෂ නායකතුමා කිව්ව ආකාරයට ඒ කටයුතු කිරීම සුදුසුයි. මම ඒ යෝජනාව ස්ථිර කරනවා. උන්වහන්සේ කියලා තිබෙනවා අනාගතයේ ඒ සැලසුම් ඉදිරිපත් කරනවා කියලා. මම හිතනවා ඒ සැලැස්මත් අපට ඉදිරිපත් කරලා තිබුනානම් හොඳයි කියලා. විපක්ෂ

නායකතුමා කිවූ ආකාරයට සභාව සතු කොටසයි ආගමික ස්ථානය සතු කොටසයි එක්ක ඉදිරිපත් කරන සැලැස්ම පිළිබඳ ඉදිරියේදී අපට සලකා බලන්න වෙයි.

ඒ අනුව අලව්ව බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකර ඇති සීමාව තුළ සංවර්ධන කටයුතු පවත්වාගෙන යාමට අවසර ලබාදීම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**03.12** <u>**කාලය දීර්ඝ කරගැනීම සම්බන්ධව.**</u>

බෝයවලාන ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය පවත්වාගෙන යාම සඳහා තාවකාලිකව ලබා දී ඇති අප සභාවට අයත් ප්‍රජා ශාලා ගොඩනැගිල්ලේ විදුලිය, නඩත්තු කිරීමේ කටයුතු සහ පිරිසිදු කිරීමේ කටයුතු දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් සිදු කිරීමට එකඟ වන බැවින් ප්‍රජා ශාලා ගොඩනැගිල්ල 2023.02.01 දින සිට ඉදිරි මාස 02 ක කාලයක් සඳහා ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම ඉටුකර දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.02.01 දින සිට ඉදිරි මාස 02 ක කාලයක් සඳහා එනම් 2023.03.31 දක්වා බෝයවලාන ප්‍රජාශාලා ගොඩනැගිල්ල කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ආයුර්වේද වෛද්‍ය සායනය පවත්වාගන යාමට ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**03.13** <u>**බෝයවලාන පොලිස් ස්ථානය පිහිටි ඉඩම ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරාදීම සම්බන්ධව.**</u>

අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව මේ සමඟ යොමු කර ඇති අනුරේඛන අංක 2022/05 හි කැබලි අංක A ප්‍රමාණයෙන් රූඩ් 01 පර්. 30 ක් වූ ප්‍රමාණය බෝයවලාන පොලිස් ස්ථානය සඳහා ද, කැබලි අංක B ප්‍රමාණයෙන් රූඩ් 01 පර්. 16.93 ක් වූ ප්‍රමාණය නැබඩවතුර ප්‍රදේශයේ ජනතාව සඳහා පොදු කටයුතු වෙනුවෙන් ද වෙන් කරන බවත් කැබලි අංක A පොලිස් දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සම්බන්ධයෙන් පොලිස් ස්ථානාධිපති, බෝයවලාන පොලිස් ස්ථානය විසින් නිරන්තරව විමසීම් කරන බැවින් ඒ සඳහා එකඟතාවය ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කර ඇත.

එමෙන්ම 2022.11.15 දින මහා සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉහත ඉඩමෙන් පර්. 20 ක භූමි ප්‍රමාණයක් ප්‍රවේශ මාර්ග පහසුකම් සහිතව මැනුම් කර වෙන් කර දීමෙන් අනතුරුව අලව්ව පොලීසිය පිහිටි භූමිය ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරා දිය හැකි බව තීරණය කර ඇති අතර ඒ බව ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත 2022.12.05 දිනැති ලිපියෙන් දැනුම් දෙන ලද බවත් කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවත් ලේකම්තුමිය විසින් වාර්තා කර ඇත.කාර්මික නිලධාරී ස්ථාන පරීක්ෂණ වාර්තාවට අනුව පොලිස් ස්ථානය භාර නිලධාරීතුමා එම ස්ථානයේ නොසිටි බැවින් ඒ වෙනුවට එහි වෙනත් නිලධාරිනියක් අදාල මිනුම් ලක්ෂ්‍ය තිබිය යුතු ස්ථාන විය හැකි බවට ස්ථාන කීපයක්පෙන්වුවද මිනුම අවසානයේ ස්ථිර සලකුණු යොදා මිනුම් අවසන් කර නොමැති බව වාර්තා කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට තිබුණා මුලින්ම ඔය ඉඩම මැනල වෙන් කරන්න. අපිට මේක පේන්නේ අසම්පූර්ණ දෙයක් විදියට. එතුමියට පුලුවන් නම් ඒකට විතරක් මැනුම් කරන්න එතුමියට තිබුණා මුළු ඉඩමම මිනින්දෝරු මහත්තුරු ලවා මේ ප්‍රමාණය වෙන් කරලා දෙන්න කියලා ඉල්ලීම් කරන්න. මම යෝජනා කරනවා සම්පූර්ණ ඉඩම මැනල වෙන් කරලා දෙන ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරමු කියලා. ඊට පස්සේ අපි ඒ අයගේ කොටස වෙන් කරලා දෙමු. එතකොට කිසිම ගැටලුවක් නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අද පොලීසියට මුදල් පාස් වුණත් පොලීසියට ඉදිකිරීම් කරන්න බෑ. මොකද අපි අවසරය දීලා නැති නිසා. පොලිසිය හැදෙනවට අපි කාගෙවත් විරෝධයක් නැහැ. නමුත් ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් වෙනුවෙන් සේවා පියස හදන එකටත් අපි කවුරුවත් දන්නැතුව කැල්ලක් වැඩ කරලා තිබෙනවා. අපි පැහැදිලිවම කිව්වා ඒක ලිඛිතව දෙනකල් අනුමැතිය දෙන්න බැහැ කියලා. ඊට පස්සේ තමයි ඔය ලිපිය එවල තියෙන්නෙ නමුත් ඕකෙන් අපට සෑහීමකට පත්වෙන්න පුළුවන් කමක් නෑ. නාරද මන්ත්‍රිතුමා කිව්වා වගේ කැල්ලක් වෙන් කලා කිවුවට බෑ. මුළු ඉඩමම මැනුම් කටයුතු කරලා අපට නිශ්චිතව රජයේ නිලධාරීන්ගේ කාර්යාලයයි සේවා පියසයි සහිත ශාලාවයි ඉදිකරන්න වෙන් කරන්න කියලා ඉල්ලා සිටිනවා. දැනට දත්ත පද්ධතියේ ඇතුල් කරලා තිබෙනවා කියනවා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සේවා පියසක් හදන්න. පොලිසිය අපහසුතාවයට පත්වෙලා තිබෙන ආකාරයත් අපි තේරුම් ගන්න ඕනෑ. පොලිස්පතිතුමා අඩු පහසුකම් සහිත ස්ථාන වලට වැඩි මුදලක් වෙන් කරලා ඇති. නමුත් මෙයට නීත්‍යානුකූලභාවය හරස් වෙලා තිබෙනවා. ඒ නිසා මේක ඉක්මනින්ම ප්‍රාදේශීය ලේකම්තුමිය මැදිහත් වෙලා මුළු ඉඩමම මැනලා මෙම තත්ත්වය දුරු කරලීමට කටයුතු කරනවා නම් හොඳයි. එහෙම වුනොත් අපිටත් හැකි ඉක්මනින් මේ සඳහා අනුමැතිය දෙන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි කියන්න ඕනෑ මේක නීත්‍යානුකූලව දෙන්න කියලා. රජයේ ඉඩමක් වුණත් ඒක මැනුම් කරලා වෙන් කරන්න අවශ්‍යයි. මුළු ඉඩමම මැන්නම ගැටලුවක් නෑ.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අපි ප්‍රාදේශීය ලේකම්තුමියට ලිඛිතව දන්වලා තිබෙනවා සභා වාර දෙකක ඔබතුමාලා තීන්දු ගත්තා මේ කොටස නියමාකාරව මැනල වෙන් කර ගන්නා තුරු පොලීසියට අවසර දෙන්න බැහැ කියලා. ඒ තියෙද්දි තමයි නිතර නිතර අපට කියන්නේ මේක දෙන්න කියලා. පොලීසිය දන්නේ නැනේ ඒ ක්‍රියාවලිය. පොලීසිය හිතන්නේ අපි මේක නොදී නවත්වාගෙන ඉන්නවා කියලා. ප්‍රාදේශීය ලේකම්තුමිය අතේ තමයි ඉතිරි කොටස තිබෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔබතුමිය ලිපියක් යවන්න කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරු දෙදෙනෙක් සම්බන්ධ කරගෙන මුළු ඉඩමම මැනලා ඉදිරි කටයුතු කරන්න.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අපිට එවලා තිබෙන්නේ අනුරේඛනයක්. ඒකේ තිබෙනවා බෝයවලාන පොලිස් ස්ථානය තිබෙන ඉඩම් කොටස සහ රජයේ ඉඩමේ මායිම පෙන්වන අනුරේඛනය. අලව්ව ප්‍රාදේශීය ලේකම්ගේ අංක

2021/01 සහ 2022/02 සහ 2022.02.19 දින ලෙස තමයි මැනුම් ඉල්ලීම තිබෙන්නේ. මේ දළ සටහනේ මායිම් පෙන්නපු හා මායිම් බලාගත් අය තමයි ජනපද නිලධාරී හා ප්‍රාදේශීය ලේකම්, අලව්ව. මේක අත්සන් කරලා තිබෙන්නේ ලියාපදිංචි රජයේ මිනින්දෝරු, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ පුද්ගලයෙක්. ප්‍රාදේශීය ලේකම්තුමිය මේවා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ඉදිරිපත් කලා නම් එතන ඉන්නවා මේ හැම ක්ෂේත්‍රයකම නිලධාරීන් හා දේශපාලන අධිකාරිය. එතනදි මේ ගැටළුව නිරාකරණය කරගන්න පුළුවන්.

ඒ අනුව කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරු දෙදෙනාගේ සහභාගිත්වයෙන් මුළු ඉඩමම මැන ගම්වාසීන්ගේ පොදු කටයුතු සඳහා ඉඩම් කොටසක් නියමිත ලෙස වෙන් කර දීමෙන් අනතුරුව මේ සඳහා අනුමැතිය ලබා සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**03.14 <u>ව/ගිරි/වයඹ ජනාධිපති විද්‍යාලය පිහිටි ඉඩම අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සඳහා.</u>**

980, මැදගම්පොල ග්‍රාම නිලධාරී වසමේ ව/ගිරි/වයඹ ජනාධිපති විද්‍යාලය පිහිටි ඉඩම අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලෙස වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් ඉල්ලීමක් කර ඇති බවත් ඒ සඳහා අප සභාවේ එකඟතාවය ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කරමින් අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මම ඔබතුමාලට පොඩි කාරණාවක් කියන්නම්. දවසක් හදිසියේ ක්‍රීඩා පිටිය මනිනවා කියල ඒ අවස්ථාවට කෑම දෙන්න කියල කතා කලා. එදා ලේකම්තුමිය හිටියෙත් නෑ. එතුමිය පොල්ගහවෙල වැඩ බලන්න ගිහිල්ලා. මම හිටියෙත් නෑ. කව්රු මනින්න ආවද, කොහෙන් ආවද මොනවත් දන්නෙ නෑ. අපි කිව්වා අපිට ඒක කරන්න බෑ කියලා. අපි දන්න තරමට නම් නගරයක තිබෙන ප්‍රධාන ක්‍රීඩා පිටිය අනිවාර්යෙන්ම අයිති වෙන්න සභාවට හෝ නගර සභාවට. මෙතෙක් කාලයක් ඕක නඩත්තු කලෙත් මේ සභාවෙන්. දැන් මේ ලිපියෙ ඉල්ලන්නෙ ජනාධිපති විද්‍යාලය පිහිටි ඉඩම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පවරලා දෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ජනාධිපති විද්‍යාලය දරුවන්ට අධ්‍යාපනය සපයන ස්ථානයක්. අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් පහසුකම් සපයන්න නම් ඒ පාසල අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ තිබිය යුතුයි. ඒ නිසා මෙම විද්‍යාලයේ භූමිය අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පවරලා දෙන ලෙස ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම් කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් කිසිම ගැටළුවක් පැන නගින්නේ නෑ. ඒ නිසා මේ සඳහා සභාවෙ අනුමැතිය ලබා දීම සුදුසු බවට මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 980, මැදගම්පොල ග්‍රාම නිලධාරී වසමේ ව/ගිරි/වයඹ ජනාධිපති විද්‍යාලය පිහිටි ඉඩම අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට එකඟතාවය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**3.15 <u>අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන අංශයේ පරිගණක යන්ත්‍රය අළුත්වැඩියා කිරිම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරිම.</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන අංශයේ රාජකාරි සඳහා භාවිතා කරනු ලබන පරිගණක යන්ත්‍රය අළුත්වැඩියා කිරිම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් නො. 137, මහ විදිය, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක රියල් පී.සී සොලියුෂන් ආයතනයෙන් අවම මිලගණන් ඉදිරිපත් කර ඇති අතර ඒ පිළිබඳ තිරණයක් ගැනිම සඳහා ඉදිරිපත් කරමි.

| අනු අංකය | භාණ්ඩ, ද්‍රව්‍ය හා සේවා විස්තරය | ඉදිරිපත් කර ඇති මිල ගණන් | | |
|---|---|---|---|---|
| | | Z MAX computers, නො 22, මීගමු පාර, ගිරිඋල්ල | රියල් පී.සී සොලියුෂන් නො. 137, මහ විදිය , අලව්ව | SKS computers 34/1 රවුම් පාර, ගිරිඋල්ල. |
| 01 | ඩෙක්ස් ටොප් පරිගණකයේ HARD disk එක අලුතින් දැමීම සහ අළුත්වැඩියා කිරිම | රු.7750.00 | රු.7000.00 | රු.7550.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අවම මිලගණන් ඉදිරිපත් කර ඇති නො. 137, මහ විදිය, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක රියල් පී.සී සොලියුෂන් ආයතනයෙන් මිල දී ගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන අංශයේ රාජකාරි සඳහා භාවිතා කරනු ලබන පරිගණක යන්ත්‍රය අළුත්වැඩියා කිරිම අවම මිලගණන් ඉදිරිපත් කර ඇති නො. 137, මහ විදිය, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක රියල් පී.සී සොලියුෂන් ආයතනයෙන් සිදුකිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**3.16 <u>අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් මැටියගනේ - අලව්ව මාර්ගයෙහි මැටියගනේ මංසන්ධියෙහි විල්ගමුව මාර්ගය හරහා ජලනල එලිම.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

පොල්ගහවෙල, පොතුහැර සහ අලව්ව එකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් මේ වන විට අලව්ව ප්‍රදේශය තුල ජල නල එලීම කටයුතු 97% පමණ අවසන් කර ඇති බවත් වැල්ව් කුටීර කිහිපයක් ස්ථාපිත කිරිම සහ මංසන්ධි කිහිපයක් හරහා ජලනල එලිම, නිම කිරිමට ඉතිරිව ඇති ප්‍රධානම කාර්යයක් බවත් මේ අතුරින්, මැටියගනේ මංසන්ධියෙහි විල්ගමුව මාර්ගය හරහා ජලනල එලීම ප්‍රධාන වන බවත් මෙම අලව්ව- මැටියගනේ මාර්ගයෙහි 5Km පමණ ජල නල එලීම අවසන් කර ඇති අතර මේ හරස් මාර්ග ජලනල එලීමද 2020 වසරේදී සිදු කළ බවත්, මෙම මාර්ගය පුළුල් කිරිම සහ සංවර්ධන කටයුතු හේතුවෙන් මේ වන විට ජලනල මාර්ගය මැදට ස්ථානගතව පවතින බැවින් මෙම මං සන්ධියෙහි හරස් මාර්ග ජල නල සම්බන්ධ විල්ගමුව කාපට් කරන ලද මාර්ග හරහා සිදු කල යුතුව ඇති බවත් මෙය සිදු කල නොහැකිවුවහොත් එම ප්‍රදේශයට පානීය ජලය සැපයිම සිදු කල නොහැකි බැවින් එම මාර්ගය දිගේ ජලනල එලිම වෙනුවෙන් වියදම් කල මුදල් අපතේ යාමක්ද සිදු වන බවත් එබැවින්, විල්ගමුව මාර්ගය හරහා ජල නල එලිම සඳහා අපසභාවේ අනුමැතිය ලබා දෙන

මෙන් ඉල්ලීම් කරමින් ලිපියක් ඉදිරිපත් කර ඇත. මෙම ජල නල එලිමේ කාර්ය අවසන් වූ වහාම, මෙම ස්ථානය ABC යොදා Prime කිරීම සිදුකර තාවකාලික ප්‍රතිස්ථාපනය සිදු කිරීමෙන් සතියක කාලයකට පසු කාපට් යොදා ස්ථිර ප්‍රතිස්ථාපනය සිදු කරන බවද එම ලිපියේ සඳහන් කර තිබෙනවා. මේ සම්බන්ධයෙන් සභාවේ එකගතාවය ලබාදීමට ඔබතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මල්ලැහැව හන්දියේ පාර පළුදු කර එම ස්ථානය යන්න බැරි තත්වයට ආවා. පසුව ABC ගෙනත් දැම්ම එච්චරයි. ඊට පස්සෙ හදනවා කිව්වට ඕවා වෙන්නෙ නෑ. ඔබතුමියගේ නිවසට යන පාරත් ඒ විදිහට තමයි. කොන්ත්‍රාත් ගන්න අය මේවා කරල එයාලගේ කාර්යය ඉවර වුනාම ඒ අය යන්න යනවා. රටේ මහජන මුදල් විනාශ වෙනවා. වියදම් කරල සංවර්ධනය කරපු මාර්ග ටික ආයේ කඩනවා. මේකට අනුමැතිය දුන්නට කමක් නෑ. අපි ඉල්ලීමක් කරන්න ඕනෑ. නැවත පාර තිබුණ විදිහටම හදන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ලිපියේ තිබෙන විදිහටම ඒ කටයුතු වෙනවා නම් ඇත්තටම හොඳයි. ප්‍රදේශයේ ජනතාවට අත්‍යාවශ්‍ය දෙයක් තමයි ජලය. ඒ ව්‍යාපෘතිය විය යුතුයි. මෙතුමා කිව්වා වගේ ඒ පාරවල් නැවත තිබුණ විදිහට යථාවත් කරල දෙන්න කියල ඉල්ලීම කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මේ අය මා සමඟ සාකච්ඡා කළ පසුව මා ඔවුන්ට දැනුවත් කලා කට වචනයෙන් කියල බෑ, ලිඛිතව අපිට ලබා දෙන්න කියල. එහිදී ඔවුන් සඳහන් කළා ගිවිසුම්ගතවෙලයි මේ කටයුත්ත කරන්නේ කියලා. ලිපියේ තිබෙන්නේ ABC දාල සතියක් ගියාට පසුව තමයි කාපට් ඒක දාන්නෙ කියලා. මල්ලැහැව හන්දියයි අපේ නිවෙස් වලට යන පාරේ හන්දියයි ගැනත් කථා කලා. ඒ ප්‍රෙෂර් මැනලා බලන එක අතුරු මාර්ගවලට ජල සැපයුම දීල ඉවර වෙනතුරු වහන්න බෑ. ඔවුන් ඒ කාර්ය කාලයක් තිස්සේ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, විල්ගමුව ප්‍රදේශයට ජලය අවශ්‍යයි. ඒ ප්‍රදේශයේ ජනතාවට වතුර දීල කාපට් එක හරියට යොදන්න කියල ඉල්ලීම් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ ජලනල ව්‍යාපෘතියට මුලින්ම පොතුහැරින් මුල්ගල තියල අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති පළමු සාකච්ඡාවෙදීම කතා කරල කිව්ව අපේ සංවර්ධනය කලයුතු පාරවල් කිහිපයක් තිබෙනවා ජලනල එලනවා නම් කියන්න කියලා. ජලනල එලීම පටන් ගත්තෙ 2020 නම් එයාලට තිබුණනේ මේ විල්ගමු පාරේ කාපට් එක අයින දිගේ මේ ලයින් එක යන්න. කාපට් එක දාන්න කලින් එදා වතුර ලයින් එක යන්න තිබුණා. පාර අයිනේ නොවෙයි පාරේ මැදයි වතුර ලයින් එක ගිහින් තිබෙන්නේ. විශේෂයෙන්ම මේ අය සමඟ පැහැදිලිවම ගිවිසුමකට යන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔය සමාගමේ ගෙවීම් කරන කොට අඩි 10 න් 10 ට මේ අය පේමන්ට් දානවා. එතකොට කොන්ත්‍රාත්කරුවට මේක නිමා කරන්න අවශ්‍ය වෙන්නෙ නෑ. ඒ අය පාරක් කපල ඉවර කරන තුරු ගෙවන්නෙ නැතුව හිටියානම් කඩිනමින් එම කටයුතු කරනවා. මේකට අපේ කාර්මික නිලධාරි මහතෙකු යොදවන්න ඕනෑ අධීක්ෂණය කරන්න.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

පොතුහැර, පොල්ගහවෙල මේ ව්‍යාපෘතිය ගිවිසුමකට ඇවිල්ලයි සිදු කරන්නෙ. මේ ව්‍යාපෘති ගේනකොට මොන සමාගමෙන්ද කෙරෙන්නෙ කියල අපි කවුරුත් දන්නෙ නැහැ. විල්ගමුව පාරෙ පාර හරහා තමයි කඩන්න තිබෙන්නෙ. පාර හදනකොට වතුර දෙනකොට අපේ බල ප්‍රදේශයේ අපි ටිකක් අවධානයෙන් ඉන්න ඕනෑ. මෙතන අපි කතා කරන්නෙ අපි නොදැක්ක දෙයක් ගැන. අපි බලන්න ඕන මේක හරිද වැරදිද කියල. කවුරු හරි ඉල්ලපු නිසානෙ පාර කාපට් කරන්න ඇත්තෙ. මම මැදිහත්වෙලයි මේ බල ප්‍රදේශයේ ජලය ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ දැක්වෙන සිතියම පවා ඉල්ලා ගත්තෙ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔබතුමිය කියන ඒ අධීක්ෂණය අපි හැමෝම කරන්න ඕනෑ තමයි. හැබැයි අපිව දැනුවත් කරලවත් සාකච්ඡා කරලවත් ලිඛිතවත් කාටවත් මේ සංවර්ධන කටයුතු ගැන කියන්නෙ නෑ. ඒ අය හිතුමතේටයි මේ වැඩ පිළිවෙල යන්නේ. ඔබතුමිය මැදිහත් වෙලා අපිට සම්බන්ධීකරණයක් කරන්න ඒ වැඩ පිළිවෙල සම්බන්ධව.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි තීරණයක් ගත්තා මේ මාර්ග සංවර්ධනය කරන විට ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට වතුර ටික ගන්න අවස්ථාවක්වත් ලබා දෙමු කියලා. මොකද නැත්තනම් අයෙත් පාර කඩන්න සිදු වෙනවා. ඒක ලොකු අපරාධයක්. ඒ නිසා මේ සභාව ගත්ත ප්‍රතිපත්තිමය තීන්දුවට කවුරු හරි නිලධාරියෙක් ගිහිල්ල සාකච්ඡා කරන්න ඕනෑ. මේ පාර හරහා ජල නලයක් එලා ගන්න යම් පුද්ගලයෙක් උත්සාහවන්ත වෙනවා නම් රු. 50,000.00 ක් විතර සභාවට ගෙවාගන්න නොහැකි හින්දනේ මේ ඉල්ලීම කරන්නේ. එතනදි තරයේ ඔබතුමිය දැඩි තීරණයක ඉන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මේ එක්කම යන මාර්ගයක් තමයි කෝහිටියාව මාර්ගය. ඒ මාර්ගයේත් ගමන් කිරිමට අපහසු තරමටම මාර්ගය සෝදාගෙන ගිහිල්ල තිබෙනවා. ඒ ගැනත් ඔබතුමියගේ අවධානය යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා.

ඒ අනුව ගිවිසුමකට යටත්ව කාර්මික නිලධාරී අධීක්ෂණය යටතේ නැවත යථා තත්වයට පත් කරන පොරොන්දුව පිට මේ සඳහා අනුමැතිය ලබාදිම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**3.17**<u>**අලව්ව සතිපොල භූමියේ තෙකලා විදුලි සැපයුම ලබාගැනීම සම්බන්ධවයි**</u>

අලව්ව සතිපොල ඉදිකිරීම් කටයුතු සිදුකල ෂාම්හිල්ස් කන්ස්ට්‍රක්ෂන් ආයතනය මගින් අලව්ව සතිපොල සංවර්ධන කටයුතු ඉටුකිරීමේදී සභාවේ එකගතාවය මත තෙකලා විදුලි සැපයුම ලබාගෙන තිබූ අතර මේ වන විට එහි සංවර්ධන කටයුතු අවසන් කර සතිපොල ආපසු සභාව වෙත භාරදී ඇත. මේ වන විට සතිපොලේ කටයුතු සඳහා තෙකලා විදුලිය අත්‍යාවශ්‍ය බැවින් එම විදුලි පහසුකම අඛණ්ඩව ලබාගත යුතුය. සතිපොල සංවර්ධන කටයුතු සිදුකළ කාලසීමාව තුළ එහි විදුලි බිල ඉහත ආයතනය මගින් ගෙවීම් කළ අතර එහි අවසන් බිල ඔවුන් විසින් ගෙවීම් කර නොමැත. ඒ හේතුවෙන් 2023.02.14 දින සතිපොල විදුලිය විසන්ධි කිරීම හේතුවෙන් (ලං.වි.ම.) එහි පවතින හිඟ මුදල රු. 23,488.51 ක මුදල ගෙවීම් කළ යුතු බවත් එසේ නොමැති නම් මෙම තාවකාලික විදුලි සැපයුම විසන්ධි කරන බවත් දැනුම් දී ඇති අතර සභාවට නැවත සතිපොල සඳහා විදුලි සබඳතාවය වෙනම ලබාගත යුතු බවත් ඒ සඳහා රු. 25,000 කට වැඩි මුදලක් ගෙවීම් කිරීමට සිදුවන බවත් නාරම්මල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය දැනුවත් කර ඇත. ඉහත ආයතනය විදුලි බල මණ්ඩලය වෙත රු. 25,000.00 ක ඇප තැන්පතුවක් ලබා ඇති අතර සභාව මගින් ඉහත රු.

23,488.51 ක මුදල ගෙවන්නේ නම් ඉහත සබඳතාවයම සභාව නමින් ලබාදීමට ඉහත පාර්ශවය එකඟතාවය ලබාදී ඇත. ඒ අනුව මෙම හිඟ මුදල සභාව මගින් ගෙවා යලි විදුලි සම්බන්ධතාවය සභාව වෙත ලබා ගැනීම සඳහා සුදුසු තීරණයක් ගැනිමට ඉදිරිපත් කරන ලද ලිපිය .

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

පොල ආරම්භ කරන විට අපට තිබුනේ සිංගල් ෆේස් එකක්. සතිපොල සංවර්ධන කටයුතු වලදි සිංගල් ෆේස් එකෙන් සංවර්ධන කටයුතු කරන්න බැරි නිසා ත්‍රී ෆේස් ලයින් එකගන්න අවශ්‍ය වුණා. ඒ ගන්නා විට කොන්ත්‍රාත්කරු මගින් තාවකාලික සැපයුමක් තමයි ගත්තේ. ඒ අනුව ඔහු කොන්ත්‍රාත් එක ඉවර කලා. අවසාන මාසෙ විදුලි බිල ඇවිත් තිබෙනවා රු. 23,488.51ක්. අපි ඔහුට ඒක ගෙවන්න කියල දැනුම් දුන්නා. නමුත් ඔහු ත්‍රී ෆේස් ලයින් එක අයින් කර ගත්තම අපට පරණ තිබුණ සිංගල් ලයින් එක ප්‍රමාණවත් නැති නිසා ත්‍රී ෆේස් ලයින් එකක් අපට ගන්න සිදු වෙනවා. කොන්ත්‍රාත්කරු රු. 25,000 ක තැම්පතුවක් ඒ කාලෙ හැටියට ගෙවල තිබෙනවා. අපට ත්‍රී ෆේස් ලයින් එක අළුතෙන් ගන්නවනම් රු. 25,000 ට වැඩි මුදලක් විදුලිබල මණ්ඩලයට අපි ගෙවන්න වෙනවා. කොන්ත්‍රාත්කරු අපට කියනවා රු 23,488.51 මුදල විදුලිබල මණ්ඩලයට සභාවෙන් ගෙවන්න. ඔහු ත්‍රී ෆේස් ලයින් එකට ගෙවපු රු. 25,000 මුදලට ගත්ත ත්‍රීෆේස් ලයින් එක අපේ නමින් දෙන්නම් කියලා. ඔබතුමාලගෙ අදහස් දක්වන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කොන්ත්‍රාත් එක ගත්ත කෙනා එකඟ වෙලා තිබෙනවා නම් සභාවට ඒක පවරලා දෙන්න විදුලි බල මණ්ඩලයෙනුත් ඒ ත්‍රීෆේස් ලයින් එකම අපට ලබා දෙන්න එකඟ වෙනවා නම් ඒ මුදල ගෙව්වා කියල ප්‍රශ්නයක් නෑ. ඒ මුදල ගෙවීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව විදුලිබල මණ්ඩලය සඳහා ගෙවීමට ඇති හිඟ මුදල වන රු.23,488.51 ක මුදල ගෙවීම කර තෙකලා විදුලි පහසුකම් සතිපොල සඳහා සභාව නමින් ලබාගැනීම සුදුසු බවට ඒකමතිකව තීරණය විය.

**04.** <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත</u>

**05.** <u>යථා පරිදි කල්දී ඇති යෝජනා.</u>

**(05-01)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/59 - 01 දරණ යෝජනාව</u>

දෛනික පදනම මත අප සභාවේ සේවය කරන ඒ.ඒ.එස්.ඕ.එම්. අලහකෝන් යන අයගේ ගිවිසුම් කාලය 2023.04.06 දිනෙන් අවසන් වන අතර ඔහුගේ සේවය තවදුරටත් සභාවට අත්‍යාවශ්‍ය වන බැවින් සේවා කාලය දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත නම් සඳහන් අයගේ සේවා කාලය ගිවිසුම් කාලය අවසන් වන දින සිට තවත් මාස 06 කින් දීර්ඝ කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-02)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/59 - 02 දරණ යෝජනාව</u>**

තක්සේරු ලේඛනයේ ඒ.ඒ. අන්මුනිරාජ් (දුම්රිය දෙපාර්තමේන්තුව) ලෙස නම සඳහන් ගොරොක්ගස්දෙණිය පාර, දකුණ අංක 10 ලෙස දේපලක් නොමැති බවත් එම දේපල මේ වන විට අංක 10 න් දිවෙන අනු අංක සඳහා ගමන් කිරීමට ඇති පාර බවට ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ බවත් ආදායම් පරීක්ෂක මහතා විසින් වාර්තා කර ඇති අතර එබැවින් එම අංකය තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවට යොජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ගොරොක්ගස්දෙණිය පාර, දකුණ අංක 10 ලෙස දේපලක් දක්නට නොමැති බැවින් එම අංකය තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-3)<u> ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/59 - 03 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ආයතනයන්හි 2022/12/31 දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට අවසන් කර ඇත.

ඒ අනුව,

01. ප්‍රධාන කාර්යාලය / ප්‍රජා ශාලාව
02. මහරච්චිමුල්ල උප කාර්යාලය
03. කැප්පිටිවලාන උප කාර්යාලය / බෝයවලාන ප්‍රජා ශාලාව / බෝයවලාන සතිපොල/ බෝයවලාන වෙළඳ සංකීර්ණය
04. නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානය
05. අලව්ව මහජන ක්‍රීඩාංගනය
06. ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය
07. අලව්ව සතිපොල
08. පොදු වෙළඳ සංකීර්ණය
09. අලව්ව / බෝයවලාන / මහරච්චිමුල්ල යන පුස්තකාල 03
10. මාබෝපිටිය-සුධම්ම/ මැදගම්පොල-මල්ගොමුව/මඩවල-මද්දුම බණ්ඩාර යන පෙර පාසල් 03

යන ආයතනයන්හි සමීක්ෂණ කටයුතු සිදු කර, එහි වාර්තා ලබා දී ඇති අතර එම සමීක්ෂණ වාර්තා මේ ලිපිය සමඟ ගරු මහ සභාවට ඉදිරිපත් කර ඇත.

එම සමීක්ෂණ වාර්තාවලට අනුව සමීක්ෂණ මණ්ඩල විසින් පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.

I. ප්‍රධාන කාර්යාලයෙන් උප කාර්යාල සහ වෙනත් ආයතනවලට ලබා දී ඇති භාණ්ඩ සහ උපකරණ එම ස්ථානවල ඉන්වෙන්ට්‍රි ලේඛනවලට ඇතුලත් කිරීම සහ ප්‍රධාන කාර්යාලයේ ඉන්වෙන්ට්‍රි ලේඛනවලින් එම භාණ්ඩ හා උපකරණ ඉවත් කිරීම.

II. ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කල යුතු භාණ්ඩ තවදුරටත් ඒ ඒ වේලාවට ප්‍රයෝජනයට ගන්නා ලේඛනයේම ඇතුලත් වී ඇති බැවින්, නැවතත් එම භාණ්ඩ ගැලපෙන පරිදි වර්ගීකරණය කර ඉන්වෙන්ට්‍රි ගත කිරීම.

III. අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් සියලු ආයතනයන්හි ඉන්වෙන්ට්‍රිගතව ඇති ඇතැම් භාණ්ඩ වල මිල ගණන් සඳහන්ව නොමැති බැවින්, තාක්ෂණ නිලධාරි ඇතුළු ත්‍රිපුද්ගල තක්සේරු කමිටුවක් මඟින් තක්සේරු කර ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කිරීම.

IV. බෝයවලාන සතිපොල භූමියේ දැනට සතිපොල ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වූ බවද එම පොල නැවත විවෘත කිරීමට සැලසුම් කිරීම.

V. බෝයවලාන පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර දිගු කලක් තිස්සේ අළුත්වැඩියා කර නොමැති බව දක්නට ලැබුණු බවද එම කඩ කාමර වල ඇතැම් දොරවල් දිරාපත්වී ගොස් ඇති අතර කඩකාමර වලින් අඩක් පමණ වසා දමා ඇති බව දක්නට ලැබුණු බව සඳහන් කර ඇති අතර වෙළඳ සංකීර්ණය මහජනතාවට වඩාත් ආකර්ෂණීය වන අයුරින් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම .

VI. අලව්ව ප්‍රාදේශිය සභාව සතු සියළු ආයතනයන්හි අළුත්වැඩියා කොට නැවත භාවිතයට ගත හැකි භාණ්ඩ / ද්‍රව්‍ය අළුත්වැඩියා කර නැවත භාවිතයට යොමු කිරීම.

VII. අලව්ව ප්‍රාදේශිය සභාව සතු සියළු ආයතනයන්හි අස්ථානගත වී ඇති භාණ්ඩ / ද්‍රව්‍ය සහ පොත් සඳහා අදාල චක්‍රලේඛ ප්‍රකාරව ඒ ඒ වකවානුවල සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.

VIII. අලව්ව, මහරව්විමුල්ල සහ බෝයවලාන යන පුස්තකාල 03 වටිනාකම ඉහළ අගයක් ගන්නා වූ නැවත මුද්‍රණය නොවන්නාවූ සංරක්ෂණය කල යුතු පොත් බැඳුම්කරණය කර පාඨක පරිශීලනයට යොමු කිරීම.

IX. අලව්ව ප්‍රාදේශිය සභාව සතු සියළු ආයතනයන්හි ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ / ද්‍රව්‍ය වෙන්දේසි කිරීම.

X. භාණ්ඩ සමීක්ෂණයෙන් පුස්තකාල තුනෙහි ඉවත් කරන ලද පරණ පත්තර තොග විකිණීම.

XI. නැවත පරිහරණය කල නොහැකි භාණ්ඩ, ද්‍රව්‍ය / පොත් පොදු 47 ආකෘතිය ප්‍රකාරව ත්‍රිපුද්ගල අපහරණ කමිටුවක් ඉදිරියේ විනාශ කිරීම.

යනාදී වශයෙන් සමීක්ෂණ මණ්ඩල විසින් ඉහත නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් පහත සඳහන් තක්සේරු හා අපහරණ කමිටු පත්කර ගැනීම සඳහාත් ගරු මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

<u>තක්සේරු කමිටුව</u>

කමිටු සභාපති - කේ.එම්. වසන්ත කුමාර මයා (ප්‍රධාන කළමනාකරණ සහකාර)
කමිටු සාමාජික - එච්.ඒ.පී. පී.හෙට්ටිආරච්චි මිය (ප්‍රජා සං. නිළධාරී )
කමිටු සාමාජික - බී.ආර්.ඒ.කේ.ගුණසේන මිය (කළමනාකරණ සේවා නිලධාරි)
කමිටු සාමාජික - ආර්. නාමල් ශෂිකාන්ත මයා (තාක්ෂණ නිලධාරී)

**අපහරණ කමිටුව**

කමිටු සභාපති - ආර්.පී.එස්.උදයලතා මිය(කළ.සේවා නිලධාරි, පොල්ගහවෙල ප්‍රා.ස.)
කමිටු සාමාජික - එච්.ජේ.පී. පී.හෙට්ටිආරච්චි මිය (ප්‍රජා සං. නිළධාරී )
කමිටු සාමාජික - ආර්.එම්.ජේ.රණසිංහ මිය (සං. නිළධාරි)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව සමීක්ෂණ මණ්ඩල විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ඉහත නම් සඳහන් අය භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තක්සේරු හා අපහරණ කමිටු සඳහා පත්කර ගැනීම සුදුසු බවත් ඒකමතිකව සභා සම්මත විය.

**(05-4)** **ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය විසින් කරනු ලබන අංක 06/59 - 04 දරණ යෝජනාව**

පාරවල් හා පටු මාවත් මැනුම් කිරීමේදී බල ප්‍රදේශයේ මගහැරී ඇති මාර්ග නැවත මැනුම් කිරීම සඳහා මැනුම් නියෝගයක් ලබා ගැනීමට අවශ්‍ය වන බැවින් ඒ සඳහා 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව නිකුත් කල අංක 2238/35 – 2021 ජූලි මස 30 වැනි සිකුරාදා ගැසට් පත්‍රයේ නියෝග 3 (1) නියෝග සංශෝධනය කිරීම සඳහා වූ භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කල නියෝග මාලාව සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බවත් එමෙන්ම අප ප්‍රාදේශීය සභාව මගින් අත්හැරී හෝ වැරදී ඇති මාර්ග 2023 ජූලි 30 ට පෙර නැවත ප්‍රකාශයට පත් කරන ලෙසත් දන්වමින් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ලිපියක් යොමු කර ඇති අතර එක් එක් කොට්ඨාශයට අයත් ගරු මන්ත්‍රීතුමා හෝ මන්ත්‍රීතුමිය මගින් අදාල තොරතුරු ලබාගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

ඔබතුමාල අතට පත් කරල තිබෙන ලේඛනයේ ඒ ඒ කොට්ඨාශවල මැනුම් කරන ලද මාර්ග පිළිබඳ සඳහන් විස්තරයක් ඇති. ඊට අමතරව මැනුම් කිරීමට ඇති මාර්ග ඇත්නම් හෝ මේ මාර්ග නම් කර ඇති නම වෙනස් කිරීමට හෝ අළුතෙන් එකතු කිරීමට ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව මාර්ග ගැසට් කිරීමේදී අත්හැරී හෝ වැරදී ඇති මාර්ග පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් හා මන්ත්‍රීතුමියන්ලාගෙන් මෙන්ම බාහිර පාර්ශවයන්ගේද අදහස් ගෙන නැවත ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට තීරණය විය.

**(05-05)ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/59 - 05 දරණ යෝජනාව**

බෝයවලාන නල්ලූර මාර්ගයට සම්බන්ධ දීපාල් යන අයගේ ඉඩම් සීමාවෙන් ආරම්භ වී මැද්දහේන හරහා විත් නැවත අලව්ව ගිරිඋල්ල ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන බෝයවලාන මැද්දහේන අතුරු මාර්ගය අදාල ගැසට් පත්‍රයේ සඳහන් අනුමත ප්‍රමාණයට පුළුල් කර සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම යෝජනාව අදාල න්‍යාය පත්‍රයට යොමු කරවීම පිළිබඳ ප්‍රණාමය පුදකර සිටිනවා. අංක 8 බෝයවලාන ප්‍රාදේශීය සභා කොට්ඨාශයට අයත් අංක 1029 බෝයවලාන ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි ඉහත සඳහන් මෙම මාර්ගය අප ප්‍රදේශයේ ජනතාව පාවිච්චි කරන ඉතා වැදගත් මාර්ගයකි. පවුල් 20 ක් පමණ ජනතාව දෛනිකව පාවිච්චි කරන මෙම මාර්ගය යාබද ගම්මාන කිහිපයක ජනතාවද බෝයවලාන නගරයට හා දුරස්ථ ගමන් යාමට අලව්ව - ගිරිඋල්ල ප්‍රධාන මාර්ගයට පැමිණීමට පාවිච්චි කරන්න සුවිශේෂී මාර්ගයක්. එසේම අලව්ව ගිරිඋල්ල ප්‍රධාන මාර්ගයටත්, බෝයවලාන නල්ලූර මාර්ගයටත් සම්බන්ධ වන ඉතා වැදගත් අතුරු මාර්ගයකි. පසුගිය අප යහපාලන රජය මගින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා "ගම්පෙරළිය" වැඩසටහන යටතේ ලබා දුන් ප්‍රතිපාදන යටතේ අප විසින් මෙම ජනතාවගේ ඉල්ලීම පරිදි රුපියල් ලක්ෂ 10 ක ප්‍රතිපාදනයක් ලබාදී මාර්ගයේ අපහසුම කොටස කුට්ටිගල් අල්ලා සංවර්ධනය කරන ලදි. මෙම මාර්ගය අදාල ගැසට් පත්‍රයේ පළල වශයෙන් අඩි 16 ක සීමාව සඳහන් වුවද දැනට මෙම මාර්ගයේ උපරිම පළල වශයෙන් අඩි 10 - 08 වශයෙන් ප්‍රමාණයට ඇති බැවින් මෙහි ගමන් ගන්නා ජනතාව බොහෝ විට විවිධ අපහසුතාවලට පත්වනු ලබයි.

මෙම මාර්ගය අදාල අනුමත ප්‍රමාණයට පුළුල් කර සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා කරන ලද ලිඛිත ඉල්ලීම් අපට සභාවේද විවිධ අවස්ථාවල ලේඛනගතව ඇත. මෙම මාර්ගය භාවිතා කරනු ලබන බොහෝ දෙනකු මේ පිළිබඳ අවධානය යොමු කරවා රජයේ ගැසට් පත්‍රයේ සඳහන්ව ඇති අනුමත ප්‍රමාණයට පුළුල් කර දෙන ලෙස නිතර ඉල්ලීම් කරනු ලබයි. එම ඉල්ලීම්වල ලිඛිත පිටපත් බොහොමයක් අප සභාවට ද යොමුව ඇත. එබැවින් මෙම මාර්ගයේ දෙපස ඉඩම් හිමියන් එක් ස්ථානයකට කැඳවා, මේ පිළිබඳව ඔවුන් දැනුවත් කර, එම අයගේ ද අදහස් ලබාගෙන කිසිවකුට අගතියක් නොවන පරිදි අදාල ගැසට් පත්‍රයේ සඳහන් ප්‍රමාණයට පුළුල් කර සංවර්ධනය කර දීමට අවශ්‍ය ඉදිරි කටයුතු ඉටු කරන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.

ඒ අනුව බෝයවලාන නල්ලූර මාර්ගයට සම්බන්ධ දීපාල් යන අයගේ ඉඩම් සීමාවෙන් ආරම්භ වී මැද්දහේන හරහා විත් නැවත අලව්ව ගිරිඋල්ල ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන බෝයවලාන මැද්දහේන අතුරු මාර්ගය අදාල ගැසට් පත්‍රයේ සඳහන් අනුමත ප්‍රමාණයට පුළුල් කර සංවර්ධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-06)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/59 - 06 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අංක 1029 බෝයවලාන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අ.ග.පි. 449 හුරිගහමුලවත්ත නමැති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිශන් සභාවට අයත් රජය සතු ඉඩම 1991.01.15 වැනි දින දඹදෙණිය පාර්ලිමේන්තු මන්ත්‍රී හිටපු අමාත්‍ය දිවංගත යූ.බී.විජේකෝන් මැතිතුමාගේ උපදෙස් පරිදි අලව්ව ප්‍රාදේශීය ලේකම් දිවංගත අබේසේකර ඇතුලත්මුදලි මැතිතුමා විසින් ඉඩම් කච්චේරියක් පවත්වා සුදුස්සන් සඳහා බෙදාදෙන ලද ඉඩම්ලාභීන්ට මේ දක්වා හිමිකම්පත් ලබා නොදීම හේතුවෙන් එම අය පත්ව ඇති අපහසුතාවය මගහැරවීම සඳහා එම අයවලුන්ට හිමිකම් ඔප්පු ලබා දීමට අවශ්‍ය කටයුතු ඉටුකරලීමට ගරු ජනාධිපතිතුමාගේ, මධ්‍යම රජයේ ඉඩම් අමාත්‍යතුමන්ගේ හා වත්මන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන්ගේ අවධානය යොමු කරලීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම වැදගත් වූ යෝජනාව අද දින සභා රැස්වීමේ අදාල න්‍යාය පත්‍රයට යොමුකර මාගේ අංක 08 දරණ බෝයවලාන ප්‍රාදේශීය සභා කොට්ඨාශයට අයත් අංක 1029 බෝයවලාන ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බෝයවලාන නගරය පිටුපස පවුල් 20 කින් යුත් නව ජනපදයේ පදිංචි ජනතාව දීර්ඝ කාලයක් තිස්සේ තම ඉඩම් වලට හිමිකම්පත් නොලැබීම නිසා විවිධ අපහසුතාවලට පත්වීම තුලින් එම අය දැනට පත්ව ඇති අපහසුතාවය පිළිබඳ අදාල බලධාරීන්ගේ අවධානය යොමු කරවීමට අවස්ථාව සලසා දීම පිළිබඳ මාගේ ප්‍රණාමය ඔබතුමිය වෙත පළමු කොට පුද කර සිටිමි.

මෙම ඉඩම 1970 - 1977 පැවැති ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ අග්‍රාමාත්‍ය ධූරයෙන් යුතු "සමගි පෙරමුණ" රජය මගින් අක්කර 50 සීමාව තුළ රජයට පැවරුන අක්කර 25 ක් පමණ යුතු පොල් ඉඩමකි. කුරුණෑගල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් පාලනය වෙමින් තිබූ මෙම ඉඩම 1991.01.15 වැනි දින දඹදෙණිය මැතිවරණ කොට්ඨාශය නියෝජනය කළ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා හිටපු කැබිනට් අමාත්‍ය දිවංගත යූ.බී. විජේකෝන් මැතිතුමාගේ උපදෙස් පරිදි අලව්ව ප්‍රාදේශීය මහ ලේකම් ලෙසට කටයුතු කළ දිවංගත අබේසේකර ඇතුලත්මුදලි මැතිතුමා විසින් හා බෝයවලාන ග්‍රාම නිලධාරී ලෙසට ක්‍රියා කළ දිවංගත වූ ජී.ආර්. රත්නසිරි මැතිතුමාගේ මෙහෙයවීමෙන් ඉඩම් කච්චේරියක් පවත්වා සුදුස්සන් තෝරා ගන්නා ලදී. ඉඩම්ලාභීන් අදාල දිනට කැඳවීමට ග්‍රාම නිලධාරීතුමාට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැනුම් දෙන ලද ලිඛිත නියෝගයේ පිටපතක් අංක 01 වශයෙන් නම් කර මා විසින් ඉදිරි කටයුතු සඳහා යොමු කරවීමට අවස්ථාවේදී සභාගත කරමි. එසේම පිඹුරු පත් අංක 449 හා අතිරේක අංක 16 දරණ රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු තැන ලෙසට කටයුතු කළ ඩබ්.වී. ජයතිස්ස මහතා මැනීම් කර කට්ටි කඩන ලද පිඹුරුපතේ පිටපතක්ද ඉදිරි කටයුතු සඳහා අදාල බලධාරීන්ගේ අවධානයට යොමු කරවීමට අංක 02 වශයෙන් නම් කර මා විසින් මෙහිදී සභාගත කරමි. එතුමා විසින් මැනීම් කර සිතියම්ගත කරන ලද මෙම පිඹුරුපතේ ග්‍රාම නිලධාරී කාර්යාලයට හා පොදු පහසුකම් සඳහා අක්කර 01 ක් හා පර්. 60 කින් යුතු ඉඩම් කට්ටි 20 ක් වශයෙන් සඳහන්ව ඇත. මෙම ඉඩම්ලාභීන් ඉඩම් ලැබ පදිංචි වී වසර ගණනාවක් ගතවනතුරු මෙම අයවළුන්ට හිමිකම් පත්‍රයක් හෝ ඉඩම් කට්ටි සඳහා කිසියම් බලපත්‍රයක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් හෝ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ලැබුණේ නැත. විටින් විට මෙම පදිංචිකරුවන් ඒ සඳහා අදාල ඉඩම් කොමිෂන් සභාව හා ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ඉල්ලීම් කළද සතුටුදායක පිළිතුරක් ලැබුනේම නැත. පසුකාලයකදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් වෙනත් යම් ක්‍රමවේදයක් අනුගමනය කර ඉඩම් ලාභීන්ගෙන් කොටසකට මුදල් අයකරගෙන අදාල හිමිකම් ඔප්පු ලබා දී ඇතත් මොනයම් පදනමක් මත එවැන්නක් කළේ ද යන්න පැහැදිලිතාවයක් නැත. කෙසේ වෙතත් මුල් පදිංචි කරුවන් 10 දෙනෙකුට හිමිකම් ඔප්පු ලබා දී නැත. එදිනෙදා කුලී වැඩක් කර ජීවිතය ගෙනයන ඔවුන්ට මුදල් ගෙවීමට තරම් ආර්ථිකයක්ද නැත. කරුණු මෙසේ තිබියදී පසුගිය අප යහපාලන රජය බලයට පත්වීමෙන් පසු හිමිකම් ඔප්පු නොලැබුන පදිංචිකරුවන් විසින් 2017.05.25 දින දාතමින් යුතුව අදාල හිමිකම් ඔප්පු තමන්ටද ලබා දෙන ලෙස ඉල්ලමින් අලව්ව ප්‍රාදේශීය මහ ලේකම්තුමාට හා අධ්‍යක්ෂ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, කුරුණෑගල යන අයට අභියාචනයක් යොමු කරන ලදි. එහි පිටපත් දඹදෙණිය ආණ්ඩු පක්ෂ සංවිධායක හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති හා වයඹ පළාත් සභාවේ විපක්ෂ නායක ප්‍රසන්න ශමල් සෙනරත් මැතිතුමාට හා අලව්ව ප්‍රාදේශීය සභාව නියෝජනය කරන අංක 08 බෝයවලාන ප්‍රාදේශීය සභා කොට්ඨාශ නියෝජිත ලෙසට මා හටද පිටපත් යොමු කර ඇත. ඉදිරි කටයුතු සඳහා යොමු කරවීමට

අංක 03 ලෙස නම් කර එම ඉල්ලීම් ලිපියේ පිටපතද මා මෙහිදී සභාගත කරමි. එසේ වුවද මේ වන තුරුම මා විසින් සභාගත කළ ලේඛනවල සඳහන් ඉඩම් හිමි කට්ටිකරුවන් 10 දෙනකුට හිමිකම් ඔප්පු තවමත් ලැබී නැත. අලව්ව ප්‍රාදේශීය මහ ලේකම් ලෙසට කටයුතු කළ පී. සුසන්ත ජයතිලක මැතිතුමා විසින් අදාල ඉල්ලුම්කාර ඉඩම් ලාභීන්ට හිමිකම් ඔප්පු ලබා දීම අනුමත කරමින් අධ්‍යක්ෂ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, කුරුණෑගල වෙත 2017.10.06 වැනි දින හා 2017.10.31 දින දාතමින් මා හටද පිටපතක් සහිතව යොමු කර ඇත. එම ලිපිද අංක 04 - i හා 04 – ii ලෙස නම් කර අදාල අයගේ අවධානයට යොමු කරවීමට සභාගත කරමි. මේ වනවිට ඉඩම් කට්ටි ලබා දුන් මුල් හිමිකරුවන් බොහෝ දෙනකු මිය ගොස් ඇති අතර ඔවුන්ගේ දරුවන් හා බිරින්දෑවරු මෙහි ජීවත් වෙති. ඔවුන්ගේ ජීවිත ගෙන යාමේදී අදාල හිමිකම් ඔප්පු නොමැති වීම නිසා ඔවුන් මහත්සේ විවිධ ගැටළු වලට මුහුණ පා ඇති බව මමද ඉතා හොඳින් දනිමි. ඔවුන්ගේ ජීවිත වඩාත් ඵලදායි ලෙසත්, යහපත් ලෙසත් ගෙනයාමට ස්වයං රැකියා ආධාරයක් හෝ නිවාස යහපත් ලෙස තනා ගැනීමට නිවාස ආධාරයක් හෝ ණය මුදලක් ලබාගැනීමට අදාල හිමිකම් ඔප්පු නොලැබීම නිසා ඇහිරී ඇත. එබැවින් මේ පිළිබඳ අදාල බලධාරීන්ගේ අවධානය යොමුකරවා මෙම අසරණභාවයට පත් අයවළුන්ට සාධාරණය ඉටු කිරීම සඳහා ඔබතුමියගේ නායකත්වයෙන් යුතු මෙම පුංචි මහජන ආයතනයට මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කිරීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරනවා. එබැවින් මෙම යෝජනාව හා මා විසින් සභාගත කළ ලිපිවල පිටපත්ද, මාගේ ප්‍රකාශය ඇතුළත් සභා වාර්තා පිටපතක්ද සමඟ ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ටත්, මධ්‍යම රජයේ ඉඩම් අමාත්‍ය ගරු හරීන් ප්‍රනාන්දු මැතිතුමන්ටත්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වත්මන් සභාපතිතුමාට හා අධ්‍යක්ෂකතුමාටත් යොමුකරවන මෙන් ඉතාම ගෞරවයෙන් ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ජයතිලක මන්ත්‍රීතුමාලා එදා 1991 තමා මේ සියළු දෙනාට බිම් කට්ටි ලබා දීලා පොදු පහසුකම් සඳහාත් අක්කර ගාණක ප්‍රමාණයක් ඉතිරි කරලා මේවා දීලා තිබුනේ. ඊට පස්සේ LRT එකෙන් ඔප්පු දෙන්නම් කියලා මැනුම් කටයුතු කරපු කීප අවස්ථාවකම දැනුවත් කරලා තිබුනා මේ අයට මුදල් ගෙවන්න කියලා. අවසානයට 2015 මේ සම්බන්ධව කතා කරනකොට පර්. 01 කට රු. 20,000 ක මුදලක් ගෙවන්න කියනවා, මේ 1991 පදිංචි පවුල් වලට. එතකොට ඒ විදියට පර්. 20 කට ගෙවාගන්න පුළුවන්කමක් ඇත්තේ නෑ පෙලක් නිවාස වලට. පස්සේ මම එවකට ආසන සංවිධායකවරයා හැටියට ගිහිල්ලා ගුණවර්ධන ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා කැබිනට් පේපර් එකකට යන්න සිදුවුනා. ඒ කැබිනට් පේපර් එක දාලා රු. 200 කට අනුමත කලා. නමුත් තාම හිමිකම්පත් ඔවුන්ට ලැබිලා නෑ. ඒ නිසා මේක විෂය භාර අමාත්‍යතුමාට යවන්න කියන ඉල්ලීම කරනවා.

ඒ අනුව බෝයවලාන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අ.ග.පි. 449 හුරිගහමුලවත්ත නමැති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් රජය සතු ඉඩමෙන් සුදුස්සන් සඳහා බෙදාදෙන ලද නමුත් මේ දක්වා හිමිකම්පත් ලබා නොදුන් අයවලුන්ට හිමිකම් ඔප්පු ලබා දීමට අවශ්‍ය කටයුතු ඉටුකරලීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ, මධ්‍යම රජයේ ඉඩම් අමාත්‍යතුමන්ගේ හා වත්මන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන්ගේ අවධානය යොමු කරලීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-07)<u>ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා විසින් කරනු ලබන අංක 06/59 - 07 දරණ යෝජනාව</u>**

අංක 05 වඩුවාව කොට්ඨාශයේ පහත සඳහන් මාර්ග ප්‍රාදේශිය සභාව වෙත පවරා ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

1. බඹරගල මාර්ගයේ නන්දසේන හේරත් මහතාගේ නිවස අසල නාන කොටුව යන මාර්ගය "නානා කොටුව මාර්ගය " ලෙස නම් කිරිම.
2. බඹරගල ලෙව්දෙනිය මාර්ගයේ ඉහල ගම නිවැසියන් ගමන් කරන මාර්ගය "ඉහලගම මාර්ගය "ලෙස නම් කිරිම.
3. මොරවල පිටිය ප්‍රධාන මාර්ගයේ මහමෙව්නාව භාවනා අසපුව අසල මගී ආවරණය අසලින් ගමන් කරන මාර්ගය " ඉඹුලවත්ත මාර්ගය " ලෙස නම් කිරිම
4. මොරවල පිටිය ප්‍රධාන මාර්ගයේ පොසොන් කුමාරි මහත්මියගේ නිවස අසලින් ගමන් කරන මාර්ගය " ගොරොක්වත්ත මාර්ගය " ලෙස නම් කිරිම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අපේ බලප්‍රදේශවල මාර්ග ප්‍රාදේශීය සභාවට පවරා දීමට අපේ වගකීමක් තිබෙනවා. අපේ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා පාරවල් හත්සිය ගාණක් තිබෙනවා. ධර්මසිරි රත්නායක සභාපතිතුමාගේ කාලේ බොහෝ පාරවල් පුළුල් කරලා තිබෙනවා. මේ පාරවල් සභාවට දාලා අනුමත කරලා තිබුනම ඊළඟට එන කෙනෙක්ට හරි පහසුවක් වෙයි. මේක ජනතාවට අනාගතයේ රුකුලක් වෙයි කියන අදහසින් තමයි මේවා මම ඉදිරිපත් කලේ.

ඒ අනුව අංක 05, වඩුවාව කොට්ඨාශයේ ඉහත සඳහන් මාර්ග ප්‍රාදේශිය සභාව වෙත පවරා ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-08)**<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමාවිසින් කරනු ලබන අංක 06/59 - 08 දරණ යෝජනාව**</u>

2023 වර්ෂය සඳහා මහජන නියෝජිතයින් හට වෙන්කරනු ලබන රු. ලක්ෂ 5 ක ප්‍රතිපාදනය උඩගන්කන්ද ඔබේසේකර පෙර පාසලේ මාර්ගය පැත්තේ ඇති වැට දැල් ගසා ආවරණය කිරීම සඳහා වෙන් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා හට මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ 2023 වර්ෂය සඳහා වෙන්කරනු ලබන රු. ලක්ෂ 5 ක ප්‍රතිපාදනය උඩගන්කන්ද ඔබේසේකර පෙර පාසලේ මාර්ගය පැත්තේ ඇති වැට දැල් ගසා ආවරණය කිරීම සඳහා යෙදවීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**06.** <u>ඇස්තමේන්තු ඉදිරිපත් කිරිම</u>

(06.1) අලව්ව පොදු වෙළඳපල මාළු ලැල්ල අළුත්වැඩියා කිරීම 1 අදියර - රු. 1,550,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඉහත ඇස්තමේන්තුව පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත සංවර්ධන කටයුත්ත සඳහා අදාල ඇස්තමේන්තුව පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>07.නිවාඩු ලිපි ඉදිරිපත් කිරිම</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පෙබරවාරි මස පැවති මහා සභාවට හා පහත කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**2023/02/14 දින මහ සභාව සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**2023/01/19 දින කාර්මික සේවා කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ර්.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**2023/01/25 දින පරිසර පොදු පහසුකම් පිළිබද කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය

**2023/01/25 දින ඝණ අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා

5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා

**2023/01/26 දින නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**2023/01/27 දින ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා

**2023/02/02 දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**08.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

**(08.1)කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තා**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2023.01.19 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2023.01.19 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.01.19 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.2) පරිසර පොදු පහසුකම් පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2023.01.25 දින පැවති පරිසර පොදු පහසුකම් පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2023.01.25 දින පැවති පරිසර පොදු පහසුකම් පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.01.25 දින පැවති පරිසර පොදු පහසුකම් පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.3) ඝණ අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2023.01.25 දින පැවති ඝණ අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2023.01.25 දින පැවති ඝණ අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.01.25 දින පැවති ඝණ අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.4) නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2023.01.26 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2023.01.26 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.01.26 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.5)ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2023.01.27 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2023.01.27 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.01.27 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.6)මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2023.02.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2023.02.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.02.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**09. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව, ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කිරීම.**

**(09-1) ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 ජනවාරි මස ප්‍රා.ස.14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 ජනවාරි මස ප්‍රා.ස. 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 ජනවාරි මස ප්‍රා.ස. 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(09-2) ප්‍රා.ස 16 ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 ජනවාරි මස ප්‍රා.ස.16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 ජනවාරි මස ප්‍රා.ස. 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 ජනවාරි මස ප්‍රා.ස.16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**10. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, දුම්රිය හරස් මාර්ගයේ තහඩු වගේ දාල තිබෙන ස්ථානය ඉතාම අනාරක්ෂිතයි එතනින් ගමන් කරන මගීන් අපහසුතාවයට පත් වෙනවා. ඒ පිළිබඳ දුම්රිය දෙපාර්තමේන්තුව දැනුවත් කරන්න කියල ඉල්ලා සිටිනවා. මම නැවත වරක් මැතිවරණයකට ඉදිරිපත් වෙන්නෙ නෑ. මම 2018 ඉදල මේ දක්වා සභාවෙන් ලබාගත්ත අත්දැකිම් බොහෝයි. එතෙක් මෙතෙක් කාලය තුල මට සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රී මණ්ඩලයට මම ස්තුති වන්ත වෙනවා. ඒ වගේම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් ස්තුති කිරිම සඳහා මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමියනි, නන්දසිරි මන්ත්‍රිතුමා කියන්නේ හොඳ යෝජනා සභාවට ඉදිරිපත් කරපු හොඳ තීරණ ගත්ත මන්ත්‍රීවරයෙක්. එතුමා මේ තුළින් ගත්ත අත්දැකීම් අරගෙන එතුමාට ඉදිරියට යන්න අවස්ථාව ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ සභාවේ මෙතුමා අපිත් එක්ක කවදාවත් දේශපාලනයක් කතා කරලා නෑ. මේ කාලය තුළ හරියටම සමාජවාදය කියන එක මෙතුමාගේ තිබුණා. මෙතුමා පක්ෂ භේදයකින් තොරව හැමෝටම සහාය වුණා. එතුමා සභාවට එන යන වෙලාවට පුස්තකාලයට ගිහිල්ලා පොතුත් අරගෙන තමයි යන්නේ. එතුමා මේ තුළින් ගත්ත අත්දැකීම් අරගෙන එතුමාට ඉදිරියට යන්න අවස්ථාව ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මට දැනගන්න ඕනෑ මේ සභාවට මධ්‍යම රජයෙන් මාසයකට කොපමණ මුදලක් ලැබෙනවාද කියලා. මම එහෙම අහන්න හේතුව මේ දිනවල පැවැත්වෙන ශාඛා සමිති රැස්වීම්වල සමහර අය කියනවා එක්කෝටි පනස් ලක්ෂයක් හැම මාසෙම සභාවට මධ්‍යම රජයෙන් ලැබෙනවලු. නමුත් අපි දන්නවා සභාවට එහෙම මුදලක් එන්නේ නැති බව. මම විශේෂයෙන්ම ඔබතුමියගේ අවධානයට යොමු කරනවා මිනිස්සුන්ගේ මනස අවුල් කරන ප්‍රකාශ නිකුත් කරනවා නම් ඒකට යම් මැදිහත් වීමක් වෙලා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා. ඒ වගේම නන්දසිරි මන්ත්‍රිතුමා තමන්ගේ පක්ෂය වෙනුවෙන් හැඟීමෙන් කටයුතු කළ කෙනෙක්.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මධ්‍යම රජයෙන් කිසිදු මුදලක් ප්‍රාදේශීය සභාවට ලැබෙන්නෙ නෑ. පළාත් සභාවෙන් මුදල් ප්‍රතිපූර්ණය කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මම හිතන්නේ ආයේ සභා වාරයකට එන්න ලැබේවිද කියන්න දන්නේ නැහැ. මගේ නිල කාලය තුළ 2018 ඉඳලා මේ දක්වා මට හැකි අන්දමින් මේ සභාව වෙනුවෙන් මම කරන්න පුළුවන් හැම යුතුකමක් කළා. ඒ අතරෙදි වචනෙකින් හෝ යම් කිසි අඩුපාඩුවක් කාට හෝ සිද්ධ වුණා නම් එයට සමාව භජනය කරනවා. මොකද පක්ෂයේ සමහර තීරණ එක්ක මම නැවත මැතිවරණයට ඉදිරිපත් නොවන නිසා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම මේ සභාවට ආවට පස්සෙ තමයි නන්දසිරි මන්ත්‍රිතුමා හඳුනා ගත්තේ. හැමවෙලේම විවෘතව කතා කළා. මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ මෙතුමා ප්‍රදේශවාසීන්ට වැඩ කරලා තිබෙනවා. ඒ වගේම වෛරීය දේශපාලනය අපි මෙතුමාගෙන් දැක්කෙ නෑ. නන්දසිරි මන්ත්‍රිතුමා, ශ්‍රියානි වසන්තා මන්ත්‍රීතුමිය අපි ඔබලා දෙන්නා ගැනම දුක් වෙනවා. ඊළඟ කමිටුවලටවත් ඔබලා දෙන්නා කමිටු නියෝජිතයෝ හැටියට පත් කරගන්න අවස්ථාවක් ලබා දෙන්න කියලා ඉල්ලමින් ඔබ වෙනුවෙනුත් අපි හැමදාමත් ඉන්නවා කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, නන්දසිරි මන්ත්‍රිතුමා කියන්නේ ජනතාව ගැන හිතලා ජනතාව වෙනුවෙන් වැඩ කරපු මන්ත්‍රීවරයෙක්. නිතරම සිතුවේ ජනතාව ගැන. ඇත්තටම මේ සභාවේ මහජන නියෝජිතයන් විදිහට කටයුතු කරන්න රාජ්‍ය නිලධාරීන් එක්ක සුහදව කටයුතු කරන්න හැකියාවක් මෙතුමාට තිබුනා. සමහර අවස්ථාවල අපි දැක්කා මෙතුමාට වෙන්කරපු මන්ත්‍රී ප්‍රතිපාදන සභාවේ පුස්තකාල

වලට යෙදෙව්වා. ඇත්තටම මෙතුමාගේ හිත පිරිසිදුයි. ඒ වගේම ශ්‍රියානි වසන්තා මන්ත්‍රීතුමිය මහජන නියෝජිතයෙක් හැටියට මේ සභාවට ආවා. මේ දේශපාලන ජීවිතයේ ලැබීම නොලැබීම් දෙකම තිබෙනවා. ඔබතුමිය වෘත්තීයෙන් ගුරුවරියක්. ඔබතුමිය ආපු ගමන හැරිලා බලන විට ඔබතුමියට සතුටු වෙන්න පුළුවන්. ඔබ දෙපලගෙන්ම ඉල්ලීමක් කරනවා. මේ සභාවේ කමිටු තිබෙනවා, ඒ කමිටුවලට හරි ඔබගේ සහයෝගය ලබා දෙන්න කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම හිතනවා අවුරුදු පහක් මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරලා බොහෝ විට අවසාන මාසය වෙන්නත් පුළුවන්. නැත්නම් තව මාසයක් තියෙන්නත් පුළුවන්. නමුත් මේ ප්‍රාදේශීය සභාව තුළ අපි සියලු දෙනා යම් යම් ආකාරයේ ප්‍රගමනයකට දායක වෙන්න ඇති. ඒ දේවල් එහෙම තියෙද්දි අපි කණ්ඩායමක් විදියට සමගි ජන බලවේගයෙන් අපි හය දෙනෙක් සහ එක්සත් ජාතික පක්ෂයේ දෙදෙනෙක්. අපි අටදෙනා බොහෝ විට එකටමයි ගමන ගියේ. ශ්‍රියානි මන්ත්‍රීතුමිය නැවත මැතිවරණයකට ඉදිරිපත් නොවුණත් අපි එකට ඒ කටයුතු සිදුකරනවා. ඒ වගේම නන්දසිරි මන්ත්‍රිතුමා ගැනත් මම වචනයක් කතා කරන්න ඕනෑ. මෙතුමා කෙලින් තීරණ ගත්තා. ඒ වගේම ප්‍රජාතාන්ත්‍රිය අදහස් තියෙන පුද්ගලයෙක්. මෙතුමා අයින් වෙලා යන එක අපට දුකක්. සමාජ සේවයේ දී අපට මන්ත්‍රිකමක් වැඩක් නෑ. සමහරවිට අපි හෙට මෙතනට පත් නොවෙන්නත් පුළුවන්. නමුත් අපිට සමාජ සේවය කරන්න, කෙනෙකුට උදව් කරන්න, වචනයකින් හරි දායක වෙන්න අපට මන්ත්‍රිකම අවශ්‍ය නෑ. ඒකට අවශ්‍ය හොඳ හිතක්, හොඳ දැක්මක් විතරයි. ඒක ඔබතුමාට තිබෙනවා කියමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, නන්දසිරි මන්ත්‍රිතුමාත් ශ්‍රියානි වසන්තා මන්ත්‍රීතුමියත් ගැන අනිවාර්යයෙන්ම කතා කළ යුතුමයි. ශ්‍රියානි මන්ත්‍රීතුමිය දිවා රාත්‍රී නොබලා සමාජ සේවයට කැප උන කෙනෙක්. එතුමියත් සමඟ අපේ ඇතිවූ බැඳීම වගේම දේශපාලනයට වඩා ගිය සහෝදරත්වයක් අපි අතර තිබුණා. ඒ වගේම නන්දසිරි මැතිතුමා ඒ කොට්ඨාශයට නිහඬව ලොකු සේවයක් කළා. එතුමා කතා කළේ අනාගත පරපුර ගැන. ඒ වගේම මන්ත්‍රීවරයෙක් අපට නැති වීම අනාගත පරපුරට විශාල ව්‍යසනයකට මග පෑදෙනවා. එතුමා පුස්තකාල ගැන, මත්ද්‍රව්‍ය ගැන නිතරම කතා කළා. ඉදිරියේදී අපේ සභාවේ කමිටුවලට හරි සම්බන්ධ වෙලා අපිත් එක්ක කටයුතු කරමු කියලා මම මතක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, නන්දසිරි මන්ත්‍රිතුමා කවදාවත් දේශපාලනික වශයෙන් කිසිඳු පක්ෂයකට මඩ ගහලා නැහැ. ඒ වගේම නිහතමානි මන්ත්‍රීවරයෙක්. මෙතුමා වැදගත් විදියට ඒ දේශපාලනය කළා. මෙතුමා ප්‍රදේශයට හොඳ සේවයක් කරනවා. මත්ද්‍රව්‍ය උවදුර දුරලන්න මෙතුමා කතා කළා. ඒ වගේම තමයි ශ්‍රියානි මන්ත්‍රීතුමිය බොහොම සුහදව අපිත් එක්ක කටයුතු කළා. ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ලොකු සේවයක් කලා. ලක්ෂ ගානක් දරු දැරියන්ගේ දෙනෙත පාදලා සමාජයේ හොඳ නරක කියල දීලා සමාජයට බුද්ධිමත් පිරිසක් බිහි කරන්න එතුමිය කටයුතු කළා. ඔබ දෙපළම සමාජයට අවශ්‍ය පුද්ගලයෝ.

ඒ වගේම මාළු ලැලිවල නැවත වතාවක් ගැටුමක් ඇතිවෙමින් යනවා. ඒ ගැන හොයලා බලන්න සභාවට එන ආදායම් නැති කරගන්න එපා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

ශ්‍රියානි වසන්තා මන්ත්‍රීතුමිය දෙපාරක් නොසිතා ඉදිරියට ඇවිත් කටයුතු කළ මන්ත්‍රීවරියක්. ඔබ කණ්ඩායම අතර ලොකු එකමුතුවක් තිබුණා. එතුමිය කාන්තාවක් හැටියට අභියෝගවලට මුහුණ දෙමින් කටයුතු කරන ආකාරය ගැන අපි ආඩම්බර වෙනවා. ඒ වගේම නන්දසිරි මන්ත්‍රිතුමා නිහඬව හිටියට නිවැරදි දෙයට නිවැරදි තීන්දු තීරණ ගන්න පසුබට උනේ නෑ. නන්දසිරි මන්ත්‍රිතුමා අඹබෝව පාසලට ජංගම පුස්තකාලයක් ලබා දෙන්න කියලා ඉල්ලීම් කළා. ඒ පුස්තකාල පොත් ලබා දෙන අවස්ථාවේ මම ප්‍රකාශ කලා එතුමාගේ ඉල්ලීම මතයි මේ කටයුතු කරන්නේ කියලා. ඒ වගේම පුස්තකාල තුන සඳහාම එතුමාගේ ප්‍රතිපාදන පුස්තකාල පොත් සඳහා වෙන් කළා. පොත් බෙදන දවසේ එතුමාට එන්න කිව්වම, එතුමා කිව්වේ, මට අවශ්‍ය නෑ පොත් ටික දෙන්නයි අවශ්‍යතාවය කියලා. අපි පුස්තකාලවල අයත් දැනුවත් කලා මන්ත්‍රීතුමාගේ ප්‍රතිපාදන වලින් ඒ පොත් ලබා දුන්නේ කියලා. එතුමා පොදු කටයුතුවලදී නිහඬව ලොකු වැඩ කොටසක් ඉටුකළා. ඔබ දෙපලටම විශාල ගමනක් යන්න, ජනතාවට සේවය කරන්න ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

ඒ අනුව අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රිතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පල කරනවා.

අද දිනට නියමිත සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 2.00ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2023/02/14
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.